
# අනාගත අභියෝගය....



රනිල් වික්‍රමසිංහ



වසර 30 ක් පුරා ශ්‍රී ලංකාව පීඩාවට පත් කළ කුරිරු යුද්ධය අවසන් වන මොහොතේ මා සිටියේ විදේශගතව ය. යුද්ධය අවසන්වීම පිළිබඳ පුවත සැලවීමෙන් පසු මා හමුවූ විදේශ රාජ්‍යතාන්ත්‍රිකයන් මගෙන් ඇසූ පළමු පැනය වූයේ *"දැන් ලංකාව කරන්නට බලාපොරොත්තු වන්නේ කුමක් ද", "පශ්චාත් යුද සමය සඳහා ලංකාවේ සැලැස්ම කුමක් ද"* කියායි. එහිදී *"ඔබේ රටවල මෙවැනි දීර්ඝ කාලීන යුද්ධයක් තිබී අවසන් වූ විට ඔබ කරන්නේ කුමක් ද"* යැයි මම පෙරළා ඔවුන්ගෙන් ප්‍රශ්න කළෙමි. එවිට ඔවුන් කීවේ යුද්ධයක් වැනි අර්බුදකාරී තත්ත්වයක් අවසන් වූ පසු ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුමක් අර්බුදකාරී වාතාවරණය පවතින සමයේ දී ම ජනතාවගෙන්, බුද්ධිමතුන්ගෙන් සහ සමාජයේ විවිධ කොටස්වලින් අදහස් විමසා සකස් කරන බවය. එසේ සකස් කරන සැලසුම ප්‍රකාශයට පත් කොට අර්බුදය අවසන් වීමෙන් පසු ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන බව ය.

මා දැනුවත්ව නම් ලංකාණ්ඩුවට එවැනි සැලැස්මක් නොමැති වුවත් කලක සිට ම ලංකාවේ ගමන් මග වෙනස් කළ යුතු බව මා හොඳින් ම වටහාගෙන ඇති බවත්, එසේ ලංකාවේ ගමන් මග වෙනස් කිරීම පිළිබඳව මා සෑම ක්ෂේත්‍රයකින්ම පාහේ අදහස් විමසා ඇති බවත් මම ඔවුන්ට දැනුම් දුනිමි. දැන් යුද්ධය අවසන්ව ඇති නිසා ඇතැම් යෝජනාවන් සංශෝධනය කිරීම පිළිබඳව මම සිතමින් සිටිනා බවත් ඔවුන්ට සඳහන් කළෙමි. එහිදී ඔවුන් අසා සිටියේ එවැනි අනාගත ප්‍රතිපත්ති පිළිබඳව මා ඔවුන් සමග කිහිප අවස්ථාක දී සාකච්ඡා කර තිබුණ ද මෙතෙක් ඒ සම්බන්ධයෙන් සැලසුමක් ඉදිරිපත් නොකළේ මන්ද කියාය. එසේ සැලසුමක් ඉදිරිපත් කළහොත් තමන්ට ද ඊට උපකාර කළ හැකි බව එම රාජ්‍යතාන්ත්‍රිකයෝ මට දැනුම් දුන්හ. යුද්ධය අවසන් බැවින් රට එක්සේසත් කර ජනතාව සංවර්ධනය කළ හැකි පැහැදිලි දර්ශනයක් ශ්‍රී ලංකාව ක්‍රියාත්මක කරන්නේ නම් ඊට නො මසුරුව ආධාර කිරීමට තමන් ඕනෑ ම මොහොතක සූදානම් බව ද ඔවුහු ම වෙත පැවසූහ.

යුද්ධය තිබියදී මා සකස් කරගෙන ගිය ශ්‍රී ලංකාවේ ගමන් මග වෙනස් කිරීමේ දර්ශනය, යුද්ධය අවසන් වී තිබෙන තත්ත්වයක් තුළ සංශෝධනය කළ යුතු ආකාරය පිළිබඳව මා සිතන්නට පටන් ගත්තේ ලංකාවට පැමිණීමටත් පෙර එහි සිටියදීමය.

මෙම වෙනස්කම් කිරීමේ දී මට ලොකු නිදහසක් ඇතිණි. එයට හේතුව කලින් සැලැස්ම මා සකස් කරමින් සිටියේ එල්.ටී.ටී.ඊ සංවිධානයට ලංකාව සම්බන්ධ ඕනෑම දර්ශනයක්, ප්‍රතිපත්ති රාමුවක් වෙනස් කිරීමට පමණක් නොව ලංකාවේ දේශපාලනය සහ දේශපාලන නායකයන් කවුරුන් විය යුතු ද යන්න පිළිබඳව තීන්දු තීරණ ගැනීමේ හැකියාව ගැන මා හට තිබූ අවබෝධය නිසා ය. ඔවුන් එය කළේ ඡන්දයෙන් නොව උණ්ඩයේ මාර්ගයෙනි. එය මගේ දේශපාලන ජීවිතයටත් ඉතා තදිඃ

බලපෑවේ ය. මෙරට ජනාධිපති ධූරයට පත්වීමට ලැබුණු අවස්ථා දෙකකදී ම එල්.ටී.ටී.ඊ. සංවිධානය ගත් තීරණ මට බොහෝ අවාසි සහගත විය. පළමුවැන්න 1999 ජනාධිපතිවරණයේ දී මගේ ප්‍රතිවිරුද්ධ අපේක්ෂිකාව වූ හිටපු ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මහත්මියට තුවාල සිදු කිරීමෙන් ජනතා අනුකම්පාව ඇය වෙත යොමු කරවීමය. දෙවැන්න 2005 ජනාධිපතිවරණයේ දී මා හට ඉතා වාසිදායකව තිබූ උතුරු නැගෙනහිර පළාත්වල ඡන්දදායකයන්ගේ ඡන්දය පාවිච්චි කිරීම වළක්වාලීම ය.

යුද්ධය අවසන් වී ඇති තත්ත්වයක් තුළ දැන් අපට එවැනි කිසිදු අභ්‍යන්තර හෝ බාහිර බලපෑම් වලින් තොරව ලංකාවේ ගමන් මග ගැන අලුතින් සිතීමට, වෙනස්කම් සිදු කිරීමට නැවුම් අවස්ථාවක් උදාවී ඇත. වසර 30 කට පසු අප ලද මේ අවස්ථාවෙන් උපරිම ප්‍රයෝජන ගන්නවා ද, නැද්ද යන්න අද අපි හමුවේ ඇති ප්‍රධානතම අභියෝගයයි.

ලංකාව නිදහස ලබා දැනට අවුරුදු 61 ක් පමණ ගෙවී ඇත. මෙම ගෙවුණු අවුරුදු 61 ක්ම අප වැය කර තිබෙන්නේ ශ්‍රී ලංකාවේ සම්පත් උකසට තබා, ජනතාවට බොරු පොරොන්දු දී බලයට පැමිණ විවිධ දේශපාලන ක්‍රම, විවිධ දේශපාලන ප්‍රතිපත්ති අත්හදා බලමින් රට විනාශයේ පතුළට ගෙන යන්නට ය. ශ්‍රී ලංකාව මේ වනවිට බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු ක්‍රමයෙන් සහ ප්‍රංශ විධායක ජනාධිපති ක්‍රමයෙන් සමන්විත වූ ආණ්ඩු ක්‍රම 3 ක් යටතේ පාලනය වී ඇත. කේවල සහ සමානුපාතික වශයෙන් මැතිවරණ ක්‍රම දෙකක් යටතේ මැතිවරණ පවත්වා ඇත. සමාජවාදී සහ මිශ්‍ර යන ආර්ථික ක්‍රම මගින් මෙරට ආර්ථිකය ශක්තිමත් කිරීමට උත්සාහ දරා ඇත. දැනුම වර්ධනය කිරීමට විවිධ වූ අධ්‍යාපන ප්‍රතිපත්ති රාමු ක්‍රියාවට නංවා ඇත.

1948 අප නිදහස ලබන විට ශ්‍රී ලංකාව ආසියාවේ සාර්ථක ම රට විය. මෙහිදී මට මතකයට නැගෙන්නේ මා කුඩා කල කොළඹ වරාය නැරඹීමට ගිය ගමන ය. එදා ජැටියේ නවතා තිබුණු කළු දුම් දමන ලොකු බට සහිත නෞකාවලින් මිනිස්සු බඩු බෑහ. ලහිලහියේ බඩු බාන කම්කරුවන් අතර කඩියන් සේ වැඩ කරන විවිධ ජාතීන්ට අයත් මිනිස්සු ද වූහ.



“අර මිනිස්සු කවුද” යැයි මා නැගූ පැනයට ලැබුණු පිළිතුර වූයේ, ඒ “සිංගප්පූරු ජාතිකයන්” යන්න ය. ඔවුන් ශ්‍රී ලංකාවට පැමිණ රැකියා කොට මුදල් උපයා නැවත සිය රටවලට ගොස් සැපසේ ජීවත් වන බව අනාවරණය විය.

තවත් දිනක මගේ පියාගේ මිතුරෙක් ගල්ඔය ව්‍යාපාරය තැනීම සඳහා අවශ්‍ය මුදල් සොයා ගත්තේ කෙසේද යන පැනය මගේ පියාගෙන් අසා සිටියේ ය. එහිදී මගේ පියා කියා සිටියේ යුද්ධ කාලයේ දී අප එංගලන්තයට පවා ණය ආධාර ලබා දුන් බව ය. එම ණය මුදල්වලට අමතරව ලංකාණ්ඩුව නමින් එංගලන්ත බැංකුවල රන් පවුම් තැන්පත් කර තිබූ බවත්, එම මුදල්වලින් ගල්ඔය ව්‍යාපාරය තැනිමට හැකි බව ඩී.එස්. සේනානායකයන් ම ප්‍රකාශ කොට තිබූ බවත් මගේ පියා මට කිය.

මේ අඩසියවසකට කලින් තිබූ ලංකාවයි. එදා අපට ගව් ගණනක් පසුපසින් සිටි රටවල් අද වන විට අපව පසුකර ගව් ගණනක් ඉදිරියට ගොස් ඇත. අද අපි රැකියා ඉල්ලාගෙන සිංගප්පූරුවට ද, මලයාසියාවට ද යමින් සිටිමු. කිසිවෙකුට ණය දෙනු වෙනුවට ලොව සිවුදෙසට ම අපි ණය වී සිටිමු.

මෙයින් පෙනෙන්නේ නිදහසින් පසු අවුරුදු 30 ක් තුළ රට ගොඩනැගීමට අප ක්‍රියාත්මක කළ ක්‍රම බොහෝ දුරට අසාර්ථක වී ඇති බව ය. එමෙන්ම අප ක්‍රියාත්මක කළ ඒ ක්‍රමවල අතුරු ඵලයක් ලෙස ඇති වූ යුද්ධය නිසා ඊළඟ අවුරුදු 30 තුළ අප විනාශයේ පතුළේ ගිලී ඇති බව ය. අප විනාශ වූයේ යුද්ධයෙන් පමණක් නො වේ. හොරකම, වංචාව, දූෂණය හා අපරාධ සමාජය පුරා උතුරා යන තරමට පැතිරී ඇත. බිය ද, කලකිරීම ද, සුන් වූ බලාපොරොත්තු ද මුලු සමාජ ක්‍රමය ම ගිලගෙන ඇත. අවසානයේ කිව හැක්කේ නිදහස ලබා ගෙවුණු අවුරුදු 61 ක් තුළ රටක් හැටියට, ජාතියක් හැටියට අප සම්පූර්ණයෙන් ම අසාර්ථක වී ඇති බවය.

මෙතැනින් ආරම්භ වන ඊළඟ අවුරුදු 30 ත් අප මේ අයුරින් ම විනාශයේ පතුළේ රැඳී සිටිනවා ද, එසේත් නැතිනම් මේ රට විනාශයෙන් ගොඩගෙන අපත් වෙනස් වී, රටත් වෙනස් කරනවා ද යන්න පිළිබඳව සිතීමට අපට ඉතිහාසය විසින් ලබා දී ඇති අනගි අවස්ථාවකි මේ. ඊට හේතුව අවුරුදු 30 ක අපගේ ගමන් මගේ අතුරු ඵලයක් ලෙස නිර්මාණය වූ යුද්ධයෙන් අප තවත් වසර 30 දුක් විඳ එහි අවසානයක් කරා පැමිණ තිබෙන බැවිනි.

ශ්‍රී ලංකාවට නිදහස ලැබී වසර 75ක් සපිරෙන්නේ 2023 වසරේදී ය. 2023 දී අප සිටිය යුත්තේ කොතැන ද යන්න තීරණය කිරීමට 2010 වසරේ ආරම්භය අපට හොඳ අවස්ථාවක් ලබා දී ඇත.

1948 දී ශ්‍රී ලංකාව ආසියාවේ සාර්ථක ම රටක් ලෙස ලෝකයා සමග ඉදිරියට යද්දී ලංකාවට වඩා ගව් ගණනාවක් පසුපසින් සිටි බොහෝ රටවල් ලංකාව පරයා ගව් ගණනාවක් ඉදිරියට ඇගෙන යාමට ජවය සැපයූ ආර්ථික විශේෂඥයින් මට කීවේ ශ්‍රී ලංකාව වෙනස් කරනවා නම් ඒ සඳහා ලැබෙන අවසන් අවස්ථාව මෙය බව ය. ඔවුන් එලෙස කීවේ අවුරුදු 30 ක වැරදිවල ප්‍රතිපලයක් ලෙස ඇතිවූ යුද්ධයෙන් අවුරුදු 30 ක් පීඩා විඳ එම යුද්ධය අවසන් කොට තිබෙන මේ මොහොතේ ලංකාව හදන්න හෝ වෙනස් කරන්න බැරි නම් යළි කෙදිනකවත් එය කළ නොහැකි නිසාය. ඔවුන් කී කතාව සත්‍යයකි. ලංකාව විනාශයේ පතුළෙන් ගොඩගෙන එහි ගමන් මග වෙනස් කිරීමට ලැබී ඇති මේ අවසන් අවස්ථාව අප ප්‍රයෝජනයට නො ගන්නවා නම් එය අප වත්මන් පරම්පරාවට පමණක් නොව මතු උපදින පරම්පරාවන්ට ද කරන මහත් අසාධාරණයකි. අවැඩකි. පාප කර්මයකි.

ඒ සඳහා පළමුව කළ යුත්තේ අපට ඉතිහාසයේ වැරදුන තැන් සොයා එම වැරදි නිවැරදි කොට ඒවා යළි ඇති නො වන්නට වග බලා ගැනීම ය. අපට වැරදුන ප්‍රධාන ම හේතුව වන්නේ ආණ්ඩු වෙනස් වන විට වෙනස් නො වන ජාතික මූලධර්ම නො තිබීම ය. තවත් හේතු බොහෝ තිබේ. නමුත් ඒවා එකිනෙකා ගෙනහැර පාමින් එකිනෙකාට දොස් පැවරීමෙන් පලක් නැත. ලංකාවේ දේශපාලන සම්ප්‍රදාය එසේ එකිනෙකාට දොස් පැවරීම ය. මෙහිදී මම, මා ගැන ම ස්වයං විවේචනයක යෙදුණෙමි. අතීතයේ අප කළ කී දෑ දෙස හැරී බලද්දී ඉන් ඇතැම් ඒවා සියයට සියයක් ම නිවැරදි ය. ඇතැම් ඒවා අඩුපාඩු සහිත ය. ඇතැම් ඒවා සම්පූර්ණයෙන් ම වැරදි ය.

වසර 30කටත් වඩා පැරණි මගේ දේශපාලන ජීවිතය දෙස ආපසු හැරී බැලීමේ දී අපට වැරදුණු තැන් සහ ඒවාට හේතු අධ්‍යයනය කිරීමටත්, එවැනි වැරදි යළි නො වීමට වග බලා ගැනීම පිළිබඳවත් මට හොඳ අවබෝධයක් ලැබුණි. මා දේශපාලනයට පිවිසුනේ ජේ. ආර්. ජයවර්ධන මහතාගේ ආරාධනයකට අනුව ය. එහෙත් මා දේශපාලනයට පැමිණීමටත් පෙර සිට ම මගේ නිවස මට දේශපාලන අත්දැකීම් ලබා දුන් විශ්ව විද්‍යාලයක් බඳු විය. ඩී.ඇස් සේනානායක මහතා කෘෂිකාර්මික විප්ලවය සිදුකරන කාලයේ පළමු ලාංකේය දිසාපති හා ඉඩම් කොමසාරිස්වරයා ලෙස ඊට දායක වූ මගේ පියාගේ පියාගෙනුත් *(සී.එල්. වික්‍රමසිංහ)*, ශ්‍රී ලංකාවට එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජිකත්වය ලබා ගැනීමට කටයුතු කළ මගේ පියාගෙනුත් *(එස්මන්ඩ් වික්‍රමසිංහ)* මම බොහෝ දේවල් ඉගෙන ගතිමි. මගේ මවගේ පියා *(ඩී.ආර්. විජයවර්ධන)*, ඩී.ඇස්. සේනානායක, සර්. ඩී.බී. ජයතිලක ආදීන් සමග පමණක් නොව මෙරටට නිදහස දිනා දීමේ පුරෝගාමීන් වූ සර් ජේම්ස් පීරිස්, පොන්නම්බලම් රාමනාදන් වැනි අය සමග ද සමීපව වැඩ කළ අයෙකි. ඩඩ්ලි සේනානායක, ශ්‍රීමත් සර් ජෝන් කොතලාවල සහ ජේ.ආර්. ජයවර්ධන සමග ද මගේ පියා ඉතා සමීපව ක්‍රියා කළේ ය.


මම ජේ.ආර්. ජයවර්ධන මහතා යටතේ නියෝජ්‍ය විදේශ ඇමැතිවරයා ලෙස ද, තරුණ කටයුතු සහ අධ්‍යාපන ඇමැතිවරයා ලෙස ද කටයුතු කර ඇත්තෙමි. රණසිංහ ප්‍රේමදාස මහතා යටතේ කර්මාන්ත හා තාක්ෂණ ඇමැති ලෙස සහ සභානායක ලෙස කටයුතු කර ඇත්තෙමි. ඩී.බී. විජේතුංග මහතා යටතේ අගමැති ධූරයේ කටයුතු කළ අතර මුදල් සහ ආරක්ෂක අමාත්‍ය ධූරවල වැඩ කටයුතු නිරීක්ෂණය කිරීමට ද අවස්ථාවක් ලැබුණි. චන්ද්‍රිකා කුමාරතුංග ජනාධිපතිනියව සිටිය දී පළමුව විපක්ෂනායක ලෙස ද, ඇය ජනාධිපති ධූරයේ සිටියදී 2001 වසරේ දී අගමැති ලෙස ද කටයුතු කළෙමි. මා අගමැති ධූරය දැරූ කෙටි කාලයේ මහින්ද රාජපක්ෂ මහතා දැරුවේ විපක්ෂනායක ධූරය ය. අද ඔහු ජනාධිපති ධූරය දරද්දී මම විපක්ෂනායක ලෙස කටයුතු කරමි.

මෙරට රාජ්‍ය නායකයින් සමග සමීපව වැඩ කිරීමෙන් මා ලබා ගෙන ඇති අත්දැකීම් සම්භාරයත්, මගේ සීයලාගෙන් සහ පියාගෙන් ලද දැනුම සම්භාරයත්, වසර 30 කට අධික මගේ දේශපාලන ජීවිතය තුළ මේ රටේ ඇති දුෂ්කර ගම්දනව්වල සංචාරය කොට ඒවායේ වෙසෙන සහෝදර ජනතාවගෙන් ලබාගත් අදහස් සහ අත්දැකීම් සියල්ලත්, රට මේ අගාධයෙන් ගොඩගෙන, ආපස්සට යාම වළකා ඉදිරියට ගෙන යන වැඩපිළිවෙළක් සැකසීමේ දී ප්‍රයෝජනවත් වේ යැයි මම සිතමි.

එසේ ම 1948 වන විට අප රට තිබූ තැනට වඩා ගව් ගණනක් පසුපසින් තිබී අපෙන් ගුරුහරුකම් ලබා දියුණු වූ රටවල් එසේ දියුණු වූයේ කෙසේද යන්න විමසා බැලීම ද ලංකාව වෙනස් කළ හැකි දර්ශනයක් සැකසීමේ දී ප්‍රයෝජනවත් වේ යැයි මම සිතමි. ජපානය එවැනි රටකි. දෙවන ලෝක යුද්ධයෙන් පසු මිත්‍ර රටවල් සමග සාම ගිවිසුමක් ඇති කර ගැනීම සඳහා 1951 දී ජපානය උදව් ලබා ගත්තේ අප රටෙනි. සිංගප්පූරුව ද එකල ආදර්ශ ගනු ලැබුයේ ඩී.එස්. සේනානායකයන්ගේ ශ්‍රී ලංකාවෙනි.

චීනයේ ඩෙන්ග් ෂියාඕ පෙන්ග් බලයට පත්වීමෙන් අනතුරුව 1979 දී ලංකාවේ සහ සිංගප්පූරුවේ ආර්ථික රටාව නිරීක්ෂණය කිරීම සඳහා නියෝජිත පිරිසක් එවනු ලැබීය. එම පිරිසේ නායකත්වය දැරුවේ පසු කලෙක චීනයේ ජනාධිපති ධූරයට පත් ජියන්ග් ෂෙමින්ග් ය.


අප අසල්වැසි ඉන්දියාව 1991 දී සිය සංවෘත ආර්ථිකය ලෝකයට විවෘත කරද්දී උදාහරණයට ගත්තේ ලංකාව ය.



**ජපන් හපන්කම්**

*1945 දී පරමාණු බෝම්බ ප්‍රහාරයෙන් පොළොවට ම සමතලා වූ ජපානය දුටු සියල්ලෝ ම සිතුවේ ජපන් රාජ්‍යය එතැනින් නිම යැයි කියාය. සාම සාකච්ඡා සඳහා සැන් ෆ්‍රැන්සිස්කෝ බලා යන ගමනේ දී ජේ. ආර්. ජයවර්ධන ජනාධිපතිවරයා ජපානයේ ටෝකියෝ හි සුප්‍රසිද්ධ 'ඉම්පීරියල්' හෝටලය ගැන ඔහු තුළ වූ මතකය එක් දිනෙක මට විස්තර කළේ ය. ජපානය යුද්ධයෙන් පරාජයට පත් වූ පසු ඉම්පීරියල් හෝටලයේ නවාතැන් ගෙන සිටියේ අමෙරිකානුවන් හා මිත්‍ර රටවල පිරිස් ය. ඔවුන් ජපන් ජාතිකයන්ට එම හෝටල් භූමිය සම්පූර්ණ තහනම් කලාපයක් බවට පත් කරමින් 'ජපන් ජාතිකයන්ට ඇතුල්වීම තහනම්' යනුවෙන් දැන්වීම් පුවරුවක් ප්‍රදර්ශනය කර තිබිණි. එම නිසා එහි නවාතැන් ගන්නා සංචාරකයන් පවා ජපන් ජාතිකයන් හමුවූයේ හෝටලයෙන් පිටතට පැමිණ මහ පාරේ තැන තැන ය.*

*නමුත් අද ජපානය ලෝක ආර්ථිකයේ ප්‍රබලතම චරිතයක් නිරූපණය කරන රටකි. පිටතට නො පෙන්නුවාට විශාල යුද බලයක් සහිත රටකි. පොළොවට ම සමතලා වූ ජපනුන් නැවත ජීවය ලැබුවේ මා පෙර සඳහන් කළ ජාතික ප්‍රතිපත්තියක් ඔවුන්ට පැවැති නිසාවෙනි. අදත් අපේ මිනිසුන් 'ජපනා හපනා' යැයි කියන්නේ ඒ නිසා ය.*



## ඉන්දියාවෙන් පාඩමක්

*නිදහස ලැබීමට පෙර ඉන්දියාව ලොව ප්‍රකට රාජ්‍යයක් නොවිණි. බ්‍රිතාන්‍ය යටත් විජිතයන් හා මහරාජාවරුන් පාලනය කළ රාජ්‍යයන් 500 ක් පමණ එකතු කොට තැනූ රාජ්‍යය ඉන්දියාව නම් විය. ඇතැමුන් කීවේ ඉන්දියාව සාර්ථක නො වනු ඇති බවත්, ඉන්දියාව කැලි කැලි වලට කැඩෙනු ඇති බවත් ය. එසේ කැඩෙන රාජ්‍යයන් ශ්‍රී ලංකාවට තර්ජනයක් වනු ඇති බවත් ඔවුහු පැවසූහ. නමුත් එකට එකතු වී ජාතික ප්‍රතිපත්තියක් ඔස්සේ වැඩ කිරීම හරහා ඉන්දියාව සාර්ථකත්වයට පත්ව ඇත.*

*හිටපු ඉන්දීය අග්‍රාමාත්‍ය අතල් බිහාර් වාජ්පායි මහතා වරක් මට සඳහන් කළේ එරට දියුණු වූයේ 1947 දී ඇති කරගත් ප්‍රතිපත්ති රාමුව නිසා බව ය. එම සැලැස්මට අනුව ඔවුන් වැඩ කළ බවත්, විකල්ප යෝජනා පවා ඉදිරිපත් කළේ එම සැලසුමට අනුගතව බවත් ඔහු සඳහන් කළේය. නමුත් 1991 පමණ වන විට ඉන්දියාවේ ආර්ථික ව්‍යුහය අසාර්ථක වූ නිසා ලෝක ප්‍රවණතාවයට අනුව විවෘත ආර්ථිකයක් බිහි කිරීමට සියලු දෙනා ම එකඟ වූ බව හෙතෙම සඳහන් කර සිටියේ ය. එහිදී ඔව්හු එය ද නව ජාතික ප්‍රතිපත්තියක් බවට පත් කළෝය. එය දීර්ඝකාලීන ප්‍රතිපත්තියක් විය. ඉන්දීය දේශපාලන පක්ෂ සිය වෙනස් දේශපාලන ව්‍යාපාර ගෙන ගියේ එකී ජාතික ප්‍රතිපත්තීන්ට අනුකූලව ය.*

## චීනයේ අත්දැකීම්

*වසර 100 ක පමණ කාලයක් පුරා පැවැති සිවිල් යුද්ධවලින් අනතුරුව මාඕ සේතුං ගේ කොමියුනිස්ට් පක්ෂය වටා මුළු චීනය ම එකතු විය. නැවතත් 1979 දී ඩෙන්ග් ෂියාඕ පෙන්ග් යටතේ චීනය සිය නව ප්‍රතිපත්ති නිර්මාණය කළේ ය. එම නව සැලැස්ම සකස් කිරීමට ඩෙන්ග් ෂියාඕ පෙන්ග් විසින් ජේ.ආර්. ජයවර්ධනයන්ගේ ශ්‍රී ලංකාවටත්, ලී ක්වාන් යූ ගේ සිංගප්පූරුවටත් නියෝජිත කණ්ඩායම් යවන ලදී. ඒ අනුව චීන අනු ලක්ෂණ සහිත සමාජවාදී නව ආර්ථික ක්‍රමයක් චීනයට හඳුන්වා දෙනු ලැබිණි. එසේ සකස් කරන ලද නව ප්‍රතිපත්ති මාලාවන් ක්‍රියාත්මක කිරීම ඔස්සේ ශීඝ්‍ර දියුණුවක් ලැබූ චීනය අද වන විට ලොව බලවත් ම රාජ්‍යයක් බවට පත්ව ඇත.*



සිංගප්පූරුව, ඩුබායි යන රටවල් දියුණු වූයේ ද එවන් ජාතික ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කළ හේතුවෙනි.

## නිදහස් ශ්‍රී ලංකාවට වයස 75 දී තරුණකම

ඕනෑ ම රටක් දියුණු කිරීම සඳහා අවම වශයෙන් වසර 25 ක් හෝ අවශ්‍ය ය. මෙහිදී පළමුව කල්පනා කළ යුත්තේ අපේ ජාතික අරමුණු මොනවාද යන්න පිළිබඳව ය. අවුරුදු 75 දී අපි දුබල වී අඩපණ වනවාද නැතිනම් ශක්තිමත් වී තරුණ වනවාද යන්න අප ඉදිරියේ ඇති අවස්ථාවන් සේ මම දකිමි. මා මෙම අදහස සාකච්ඡා සභාවකට ඉදිරිපත් කළ විට මට ලැබුණු පිළිතුර වූයේ "මොන බොරුද? 75 දී කොහොමද තරුණ වෙන්නේ" යන්න ය. එම පිළිතුර පුද්ගලයෙක් සම්බන්ධයෙන් නම් ඇත්ත ය. නමුත් රටක් සම්බන්ධයෙන් සත්‍ය තත්ත්වය එය ද? 2023 වන විට අපට නිදහස ලැබී වසර 75 සපිරේ. ඒ වන විට අප ශක්තිමත් වී ඉදිරියට යනවා ද, එසේ නැතහොත් දුර්වල වී කඩා වැටෙනවා ද යන තීරණය අප සතු ය. *'හැත්තෑපහේ තරුණකම'* යනු එය යි. එය ජයගැනීම සඳහා

අපට ජාතික අරමුණු මත ගොඩනැගුණු ක්‍රමයක් අවශ්‍ය ය. ඒ සඳහා පියවර තුනක් අනුගමනය කළ යුතුව තිබේ.

ඉන් පළමුවැන්න වන්නේ පීඩාවට පත්ව සිටින ජනතාවගේ ආර්ථික තත්ත්වය කෙටි කාලයක් තුළ දියුණු කිරීම ය. එසේම 2023 දී 75 වන නිදහස් උත්සවය පවත්වන විට ශක්තිමත් වූ ආර්ථිකයක් හා දේශපාලන ක්‍රමයක් ඉදිරියට ගෙන යාමට අපට හැකි විය යුතු ය. අවසන දී 2035 වනවිට මෙම සැලසුම සාර්ථකව ක්‍රියාත්මක වී එහි පූර්ණ ප්‍රතිපල රටටත්, ජනතාවටත් හිමිවිය යුතු ය. එම සංවර්ධනය යුගය අවසන් වන විට ජනතාවගේ ජීවන රටාව පනස් ගුණයකින් දියුණු වී ඉන්දියන් සාගරය තුළ බලවත් රටක් බවට ශ්‍රී ලංකාව පත් කිරීම මෙම වැඩ පිළිවෙළෙහි අරමුණ ය. නැවත වතාවක් ශ්‍රී ලංකාව තුළ පැරකුම් යුගයක් බිහි කළ හැකි වන්නේ මේ ආකාරයට ය. මහා පරාක්‍රමබාහු රජතුමාගේ පාලන සමයේ දී ලංකාව ඉන්දියන් සාගරයේ රාජ්‍යයන් සමග පුළුල් වෙළෙඳ සම්බන්ධතාවයන් ගොඩනගා ගෙන තිබූ බලවත් රාජ්‍යයක්ව පැවැතිණ. ඒ අයුරින් ම අප යළි බලවත් රාජ්‍යයක් බවට පත් විය යුතුව ඇත. මෙ අවස්ථාවේ දී අපේ අභිප්‍රාය විය යුත්තේ මුළු ලෝක වෙළෙඳපොළ ම ආක්‍රමණය කිරීම ය.

ශ්‍රී ලංකාව වෙනස් කරන්නේ කෙලෙස ද යන්න පිළිබඳව මා කළ දීර්ඝ අධ්‍යයනයේ දී වෙනස් වූ රටවල් අනුගමනය කළ ක්‍රම සහ ඒ සඳහා ක්‍රියාත්මක කළ කාලසටහන් ශ්‍රී ලංකාවට ගැලපෙන පරිදි ප්‍රයෝජනයට ගන්නේ කෙසේ ද යන්න පිළිබඳව මගේ අවධානය යොමු කළෙමි. අවුරුදු 25 ක සංවර්ධන යුගය සඳහා කාලසටහනක් සකස් කළෙමි.

මෙම සැලැස්ම මා සකස් කළේ රටක් හදන්න, රටක් වෙනස් කරන්න නම් ඒ රටවල් ගොඩනැගූ අත්තිවාරමේ මුල්ගල් වූ ජාතිකත්වය, රාජ්‍ය ක්‍රමය, ආර්ථිකය සහ දැනුම යන අංග විප්ලවීය වෙනසකට ලක් කළ යුතුය යන න්‍යායයන් මත පිහිටා ය. ඒ අනුව මේ දර්ශනය සකස් වී ඇත්තේ මෙම අංගයන් තුළ සිදු කරන වෙනස්කම් පදනම් කරගෙන ය. ක්‍රමවේදයන් 4 ක් මගින් මේ අංශ 4 තුළ විප්ලවීය වෙනසක් සිදු කළ යුතු ය.

1. ශ්‍රී ලංකාවේ අනන්‍යතාව මත පදනම් වූ ජාතික කොඩිය සංකේතවත් කරමින් රට එක්සේසත් කිරීම.
2. රාජ්‍ය ක්‍රමය ගොඩනැගීම සඳහා බුදුන් වහන්සේ දේශනා කළ ධර්මය වූ අපරිහානි දේශපාලනය උපයෝගී කර ගත යුතු ය. මෙ තුළින් වසර 60 කටත් වැඩි කාලයක් තිස්සේ රටත් ජනතාවත් පරිහාණියට පත් කළ රාජ්‍ය ක්‍රමයේ වෙනසක් ඇති කිරීම.
3. ආර්ථිකයේ දැනෙන වෙනසක් ඇති කළ හැක්කේ ආර්ථික සංවර්ධනයේ ප්‍රතිපල දුප්පත්, පොහොසත් සැවොම අතරේ සාධාරණ ලෙස බෙදී යන නව ආර්ථික ක්‍රමයක් ඇති කිරීම මගිනි. ඒ සඳහා ගුරු කොට ගත යුත්තේ බුදුන් වහන්සේ දේශනා කළ *"බහුජන හිතාය බහුජන සුඛාය"* යන ධර්මය මත පදනම් වූ *"සැම සිත සුව පිණිස"* වූ ආර්ථිකයකි.
4. දැනුම විප්ලවීය වෙනසකට භාජනය කළ හැක්කේ උපතේ සිට මරණය දක්වා සැම පුද්ගලයෙකුට ම සමානව දැනුම ලබා ගත හැකි ආකාරයට පහසුකම් සැලසීම හරහා ය. මෙහි කේන්ද්‍රය පාසැල ය. පාසැල, දැනුම සඳහා පමණක් නොව පවුල මූලික කොට ගත් ප්‍රජාවට පෝෂණය ලබා දෙන, සෞඛ්‍ය සම්පන්න බව ආරක්ෂා කරන, ක්‍රීඩා, කලා ඇතුලු තරුණ ක්‍රියාකාරකම් වර්ධනය කරන, විනයගරුක බව ඇති කරන, තිරසාර සංවර්ධනයට හා ග්‍රාමීය සංවර්ධනය දිරි ගන්වන කේන්ද්‍රයක් බවට පරිවර්තනය කිරීම.

## ශ්‍රී ලාංකික අනන්‍යතාව මත පදනම් වූ ජාතික කොඩිය

එල්.ටී.ටී.ඊ. සංවිධානය වරක් කොළඹ තරුපහේ හෝටල් සංකීර්ණයකට එල්ල කළ බෝම්බ ප්‍රහාරයක දී විනාශයේ ගිනිදැල් මැදින් වුව නො නැසී අභිමානවත්ව ලෙළදෙමින් තිබූ ජාතික කොඩියක් දැක්වුණු ඡායාරූපයක් එකල පුවත්පතකින් දුටිමි. ශ්‍රී ලාංකේය ජාතිය එක්සේසත් කිරීමට

නිර්මාණය කළ අපගේ ජාතික කොඩිය කවර විනාශයක් මැදින් වුව ජාතික එක්සේසත් භාවය උදෙසා යොදා ගත හැකි බවට මා තුළ වූ විශ්වාසය තහවුරු වුණේ ඒ අවස්ථාවේදී ය.

වසර 30 ක යුද්ධයේ නිමාවත් සමග අපට ස්වර්ණමය අවස්ථාවක් උදාවී ඇත. නමුත් ජාතිය එක්සේසත් කිරීමට උතුරු නැගෙනහිර ප්‍රදේශවල අපගේ ජාතික ධජය එසවීම පමණක් ප්‍රමාණවත් නො වේ. රට එක්සේසත් කිරීමට නම් 30 වසරක යුද්ධයකට මග පෑදූ මූලික ප්‍රශ්නය අප විසඳිය යුතු ය. යුද්ධය නිමා වුව ද එම ප්‍රශ්නයට තවමත් විසඳුමක් ලැබී නොමැත. උතුරේ වාසය කරන ද්‍රවිඩ ජනතාව අද ජීවත් වන්නේ අපේක්ෂා භංගත්වයට, ඉච්ඡා භංගත්වයට පත්ව ය. මෙ නිසා විදේශ දමිළ තරුණ කොටස් විසින් මෙ ප්‍රශ්නය අතට ගෙන ඇති අයුරක් දකින්නට ඇත. මේ රැඩිකල්වාදී ප්‍රවණතාවය මතු වූයේ ඉකුත් මාස කිහිපය ඇතුළතදී ය.


අප නිදහස ලබන විටදී ද එක් ධජයක් යටතේ සියලු ජාතීන් එක්සේසත් කළ හැකි අවස්ථාවක් උදාවිය. 1948 දී ඩී.එස්. සේනානායකයන්ගේ නායකත්වය යටතේ සිංහල, දෙමළ, මුස්ලිම් නායකයන් එක් සම්මුතියකට පැමිණ අපේ රටට නිදහස දිනාගනු ලැබුයේ ශ්‍රී ලාංකික අනන්‍යතාව පදනම් කොට ගෙනය. ජාති, ආගම්, කුල ආදියෙන් බෙදීමට ගියහොත් ශ්‍රී ලංකාවට අනාගතයක් නොමැති බව වටහා ගත් ඩී.එස්. සේනානායකයෝ මෙ සම්මුතියට අනුව ලාංකික ජාතියක් බිහි කිරීමට කටයුතු කළහ.



**ඩී.එස්. දර්ශනයෙන්**

***"මෙ පක්ෂයේ වූ අපි ලාංකික ජාතිය දැන් පැවැත්මේ තිබෙන බව විශ්වාස කරමු. ජාති හා ආගම් භේද අනවශ්‍ය ය. සිංහල හෝ ද්‍රවිඩ වුව ද, යෝනක ජාතික හෝ මැලේ ජාතික වුව ද, බර්ගර් නැතහොත් යුරේෂියන් වර්ගයට අයත් වුව ද අප කියන්නේ "මෙය අප ජනිත වූ අපගේම භූමිය" කියාය. බෞද්ධ හෝ හින්දු වුව ද, මුස්ලිම් හෝ ක්‍රිස්තු භක්තික වුව ද අප කියනුයේ, "අපේ භූමියට ආශිර්වාද වේවා ! යන වචනය යි." (එක්සත් ජාතික පක්ෂය පිහිට වූ අවස්ථාවේ කළ කතාවෙන්...)***

අපගේ ජාතික ගීයට "එක මවකගේ දරු කැළ බැවිනා-යමු යමු වී නො පමා" යන පද කිහිපය ඇතුළත් වූයේ ද ඒ ජාතික අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ය.



ශ්‍රී ලංකාවේ ජාතික ධජය නිර්මාණය කරනු ලැබුවේත් එම සම්මුතිය මත පිහිටා ය. ජාතික කොඩිය සඳහා ඔවුන් පදනම් කොට ගත්තේ ශ්‍රී ලංකාවේ අවසන් රජ වූ ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ කොඩිය ය. ඒ රජු දෙමළ ජාතිකයෙකි.

## ජාතික ධජය



*"1908 වසරේ ලන්ඩනයේදී මම රාජකීය සිංහ ධජය සෙවීමට උත්සුක වීමි. අහම්බයකින් මෙන් වෙල්සි රෝහලේදී මේ ධජ මට හමුවිය. දෙකක් සායම් ගොස් දුර්වර්ණව තිබිණි. අනෙක හඳුනාගත හැකිවූයේ පිළිසකර කිරීමෙන් පසුවය. ලේඛකයා ඒ ඇසුරෙන් ධජයෙහි කටුසටහනක් සකස් කළේය. රාජකීය ධජය වර්ණයෙන් පිටපත් කළේ ඩී ආර් විජේවර්ධන මහතා වෙනුවෙනි." – ඊ ඩබ්ලිව් පෙරේරා*


රාජසිංහ ධජය පදනම් කොට ගෙන ලාංකේය ජාතික ධජය නිර්මාණය කිරීමේ දී ඊට කොල සහ තැඹිලි වර්ණයන් අන්තර්ගත කළේ දමිළ, මුස්ලිම් ජාතීන් නියෝජනය කරනු පිණිසය. ජාතික කොඩිය නිර්මාණය කිරීමේ කමිටුවේ එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක, ජේ.ආර්. ජයවර්ධන, ජෝන් කොතලාවල, ජී.ජී. පොන්නම්බලම්, ටී.බී. ජයා වැනි නායකයෝ රැසක් ම සිටියහ. එම කොඩියට අපගේ ඓතිහාසික පැවැත්ම සහ ජාතීන්ගේ නියෝජනත්වය ඇතුළත් කළ හෙයින් එය අපගේ ශ්‍රී ලාංකේය කොඩිය බවට පත්විය. එසේ නම් අප කළ යුත්තේ යළිත් ශ්‍රී ලාංකික අනන්‍යතාව තහවුරු කිරීමට අපගේ ජාතික කොඩිය උපයෝගී කර ගැනීම ය.

අද විශාල ජාතික අසමගියක් අප රට තුළ ඇත. අපේ රටේ ජනතාව කියන්නේ *"මම සිංහලයෙක්; ඉන්නේ ශ්‍රී ලංකාවේ"*, *"මම දමිළයෙක්; ඉන්නේ ශ්‍රී ලංකාවේ"*, *"මම මුස්ලිම්; ඉන්නේ ශ්‍රී ලංකාවේ"*, *"මම බර්ගර්; ඉන්නේ ශ්‍රී ලංකාවේ"* කියා ය. එය අතිශයින්ම භයානක ය. මෙවැනි බෙදීම් පැවතිය ද ශ්‍රී ලාංකික අනන්‍යතාව හා ජාතික කොඩිය ඉස්මතු වන්නේ අපේ ජාතික ක්‍රිකට් කණ්ඩායම තරඟාවලීන්ට ඉදිරිපත් වන අවස්ථාවන්වලදී ය. එහිදී සියලු දෙනාම ශ්‍රී ලාංකිකයෝ බවට පත්වෙති. ඒ අයුරින් ම අප සෑම අවස්ථාවකදී ම ලාංකිකයන් ලෙස සිතන්නේ නම් රට එක්සේසත් කිරීම එතරම් අසීරු නැත. ජාතික අසමගිය දුරලා රට එක්සේසත් කිරීමට නම් අපි අප අතර ඇති අවිශ්වාසය, සැකය, බෙදීම් සියල්ල ඉවත දමා ශ්‍රී ලාංකික අනන්‍යතාවයක් බිහි කර ගැනීමට කැප විය යුතු ය.

එවිට සිංහල මහ ජාතියට සමාන ලෙස ම ද්‍රවිඩ, මුස්ලිම් සියලු ජාතීන්ටත් එක හා සමානව සාධාරණත්වය ඉටු කළ හැක. *"මම ශ්‍රී ලාංකික සිංහලයෙක්"*, *"මම ශ්‍රී ලාංකික දමිළයෙක්"*, *"ශ්‍රී ලාංකික මුස්ලිම් ජාතිකයෙක්"*, *"ශ්‍රී ලාංකික බර්ගර් ජාතිකයෙක්"* යැයි සිතා අපට ක්‍රියා කළ හැක. ඒ සඳහා සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් යන සියලු ජනකොටස් පිළිගන්නා දේශපාලන විසඳුමක් ඉදිරිපත් කිරීම අත්‍යවශ්‍ය ය. මේ ප්‍රශ්නයෙන් අපට පැන යා නො හැක. ද්‍රවිඩ ත්‍රස්ත සංවිධාන බිහිවූයේ මේ ජාතික අසමගිය නිසා ය. වාසනාවකට මෙන් අද කිසිවෙකුත් රට බෙදිය යුතු බවට ඉල්ලීම් ඉදිරිපත් නො කරති. ඒ නිසා ප්‍රශ්නය නිට්ටාවට ම සුව කිරීම සඳහා අපට මේ ලැබී ඇති ස්වර්ණමය අවස්ථාවෙන් උපරිම ප්‍රයෝජන ගත යුතු ය. මෑතකදී මා මුණගැසීමට පැමිණි ද්‍රවිඩ නායකයෙක් මට ප්‍රකාශ කර සිටියේ "පළාත් සභා ප්‍රශ්නෙදි අපේ සාධාරණ ඉල්ලීම් ඉටු කරන ගමන් සිංහල හා මුස්ලිම් ජනතාවගේ සැකයත්, බලාපොරොත්තුත් අප මතක තබා ගත යුතුයි," යනුවෙනි. මේ පිළිබඳව අපට ද අලුතින් සිතා බැලිය යුතු කරුණු ගණනාවක් ඇති බව මට එහිදී වැටහිණ.

1. *රටේ ජීවත් වන සියලු දෙනාට ම රටේ අයිතිය ඇති බව පිළිගත යුතුය.* සිංහල, දෙමළ, මුස්ලිම් යන සියලු ජාතීන්ට සමානාත්මතාවය මත පදනම්ව කටයුතු කළ යුතු ය. සාධාරණය ඉෂ්ට කළ යුතු ය. සමානාත්මතාවය හා මානව අභිමානය සුරකින, එක් එක් භාෂා, ආගම් හා සංස්කෘතීන් ගරු කරන, නීතියේ ආධිපත්‍ය පිළිගන්නා ක්‍රියාදාමයක් ඇති කළ යුතු ය. රාජ්‍ය ආයතන හා වැඩසටහන් සියල්ල මෙය යථාර්ථයක් බවට පත් කරනු පිණිස මෙහෙයවිය යුතු ය. ශ්‍රී ලාංකික අනන්‍යතාව තහවුරු කිරීමට සෑම ජනකොටසක් ම නියෝජනය වන උත්තරීතර කමිටුවක් ස්ථාපිත කොට වසර 20 ක් තුළ එම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය බලතල ඊට ලබා දිය යුතු ය. දකුණු අප්‍රිකාව පවා ක්‍රියාත්මක කළේ මෙම ප්‍රතිපත්තිය ය.

2. *පළාත් සභා ක්‍රමය අහෝසි කිරීමට අපට නොහැක.* අනෙක් අතට පළාත් සභා යන්න සුදු අලියෙක් බවට සමාජය තුළ පවතින මතයේ ද සත්‍යතාවයක් ඇත. මෙහිදී අප පළමුවෙන් ම මධ්‍යම රජයත්, පළාත් සභාත් අතර අන්තර් සම්බන්ධතාවයක් හා ඒවා එකිනෙක මත රඳා පවතින ක්‍රමයක් සකස් කළ යුතු ය. නාස්තිය වළකා ජනතාවට පළාත් සභා මගින් උපරිම සේවයක් ලැබීමට නම් මධ්‍යම ආණ්ඩුවටත්, පළාත් සභාවන්ටත්, පළාත් පාලන ආයතනවලටත් හිමි බලතල නිසි ලෙස හඳුනාගෙන ඒ ඒ විෂයයන් ඒ ඒ ආයතනවලට නිසි ලෙස පවරා දිය යුතු ය. එසේ කළ විට නැවත කිරීම් හා එම කාර්යය යළි යළි කිරීම් ක්‍රමයෙන් ඉවත් වේ. සභාවේ මන්ත්‍රී ප්‍රතිශතය අනුව පක්ෂවලට පළාත් සභා ඇමැතිකම් ලබා දිය යුතු ය. ඒ සෑම අමාත්‍යාංශයක් සඳහා අමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් මන්ත්‍රී කමිටුවක් ද ස්ථාපිත කළ යුතු ය. මුදල් පාලනය සඳහා පළාත් සභා සතු බලතල තව තවත් ශක්තිමත් කිරීම සිදු කළ යුතු ය.



පළාත් සභා බිහිවූයේ උතුරේ ජනවාර්ගික ප්‍රශ්නයට විසඳුමක් ලෙසට ය. අද මෙම පළාත් සභා ක්‍රමය තවත් ප්‍රධාන ප්‍රශ්නයකට විසඳුමක් සේ ද යොදා ගත හැක. බස්නාහිර හා අනෙකුත් පළාත් ගත් විට ඒවයේ ඇත්තේ අසමතුලිත සමාජ, ආර්ථික දියුණුවකි. ආර්ථික අංශයෙන් ගත් විට සමස්ත ශ්‍රී ලංකාවෙන් 50% කට වඩා කේන්ද්‍රගත වී ඇත්තේ බස්නාහිර පළාත තුළ ය. සෞඛ්‍ය සහ අධ්‍යාපනය වෙනුවෙන් රජයට අමතරව පෞද්ගලික අංශයේ ක්‍රමවේදයන් ද බස්නාහිර පළාත තුළ ක්‍රියාත්මක ය. මෙම පහසුකම් අනෙක් පළාත් සභා සතුව නොමැත. ග්‍රාමීය ප්‍රදේශවල පහසුකම් පවතින්නේ ඉතා අවම මට්ටමකය. ග්‍රාමීය ආර්ථිකය කඩාවැටීම නිසා බොහෝ දෙනෙක් රැකියා සොයා බස්නාහිර පළාතට පැමිණෙති. සමහරු විදේශගත වෙති. මේ කරුණු මුල්කොට ගෙන දකුණේ තරුණ කැරලි දෙකක් පැන නැගුණි. එහිදී තරුණයන් සිය සටන් පාඨය බවට පත්කොට ගත්තේ *'කොළඹට කිරි – ගමට කැකිරි'* යන්න ය. එවැනි ප්‍රශ්න නැවත නැවත පැන නැගීම වළකාලීමට නම් ගමත්, පළාතත් දියුණු කළ යුතු ය. බස්නාහිර පළාතේ මෙන් ම සිංහල, දෙමළ, මුස්ලිම් ජාතිකයන් වැඩි වශයෙන් ජීවත්වන අනෙකුත් පළාත්වල ද ආර්ථික, සාමාජයීය, අධ්‍යාපනික, සෞඛ්‍යය පහසුකම් ශීඝ්‍ර දියුණුවකට ලක් කිරීමට මෙම පළාත් සභා ක්‍රමය උපයෝගී කර ගත යුතු ය.



**ආර්ථිකයේ දායකත්වය**

*මහබැංකු වාර්තාවනට අනුව 2006 වර්ෂයේ ජාතික ආර්ථිකයට සියයට 51 ක දායකත්වයක් ලබා දී ඇත්තේ බස්නාහිර පළාතය. දෙවන තැන ගන්නා වයඹ සහ දකුණු පළාත් ලබා දී ඇති දායකත්වය සියයට 9 කි. උතුරු පලාතේ දායකත්වය සියයට 3 ක් පමණි.*


මේ සමග ම ගමට බලය ලබා දෙන ක්‍රමවේදයක් ද මීට ඇතුළත් කළ යුතු ය. බලය ක්‍රියාත්මක කිරීම දේශපාලන පක්ෂවලට පමණක් සීමා නො කොට ගමේ පොදු සංවිධාන ද ඊට එක් කර ගත යුතු ය.

3. *ශ්‍රී ලාංකික අනන්‍යතාවය තහවුරු කිරීමට ආගම් භේද ඇති නො වන ආකාරයට ක්‍රියා කළ යුතුව තිබේ.* ශ්‍රී ලංකාව ජාත්‍යන්තර සම්භාවනාවට පාත්‍රව ඇත්තේ ථෙරවාදී බුදු දහම

ආරක්ෂා කරන මධ්‍යස්ථානය ලෙස ය. ථෙරවාදී බුදුදහම සුරක්ෂිත කරමින් සෑම ආගමක් ම ඇදහීමෙ අයිතිය ද ශ්‍රී ලංකාව තුළ පැවතිම අත්‍යවශ්‍ය ය. හින්දු, මුස්ලිම්, කතෝලික ආගමික සමගිය තහවුරු කිරිම සඳහා ආගමික සහයෝගිතා ප්‍රකාශනයක් ස්ථාපිත කළ යුතු ය.

# අපරිහානි දේශපාලනය

ලංකාවේ දේශපාලනය අද ශීඝ්‍රයෙන් පරිහානියට පත්වෙමින් තිබේ. එය තේරුම් යන්නේ මෑත කාලවල දී පැවැත්වූ මැතිවරණවල දී ඡන්දය භාවිතා කිරීමේ ප්‍රතිශතය පහත වැටී ඇති ආකාරය දෙස බලන විට ය. අතීත මැතිවරණ වල දී ඡන්දය භාවිතා කිරීමේ අගය ඉතා ඉහළ මට්ටමක පැවතිණි. ඡන්දය භාවිතා කිරීමේ ප්‍රතිශතය මෙසේ පහළ බැසීමට හේතුව දේශපාලනය පිළිබඳව ජනතාව තුළ ඇති අවිශ්වාසයයි. දේශපාලනය ගැන ජනතා විශ්වාසය ඇති කළ යුතු ක්‍රමයක් ගැන මා සිතන්නට පටන් ගත්තේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය අක්‍රිය වී රට ඒකාධිපතිවාදයකට තල්ලු වී යනු ඇතැයි යනුවෙන් මසිත පවතින බිය නිසා ය. ජනතාව දේශපාලනයෙන් ඈත්වීම ප්‍රජාතන්ත්‍රවාදයට විශාල හානියකි. 1977 දී මා ජාතික රාජ්‍ය සභාවට ඇතුළු වන විට දේශපාලන ක්‍රමය පිළිබඳ රටේ ඉතා විශාල පිළිගැනීමක් තිබුණි. එය ඊට පෙර වසර 50 ක් 60 ක් පුරා ව්‍යවස්ථාදායක සභාවට, රාජ්‍ය මන්ත්‍රණ සභාවට තේරී පත් වූ සාමාජිකයන් විසින් ගොඩනංවා තිබූ තත්ත්වයකි. එසේ ම 70 දශකය දක්වා පසුව ක්‍රියාත්මක වූ ව්‍යවස්ථාදායක සභාව ද ඉතා ප්‍රශස්ත මට්ටමක පැවැතිණි. එහි පැවති විවාද පවා ඉතා සාරගර්භ විය. පොන්නම්බලම් රාමනාදන්, ඩී.බී. ජයතිලක, ඩී.එස්. සේනානායක, එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක, ජේ. ආර්. ජයවර්ධන, කොල්වින් ආර්. ද. සිල්වා, එන්. එම්. පෙරේරා, ජී. ජී. පොන්නම්බලම්, පිලිප් ගුණවර්ධන, ටී. බී. ඉලංගරත්න, අයි.එම්.ආර්.ඒ. ඊරියගොල්ල, ඩබ්ලිව්. දහනායක, පීටර් කෙනමන් වැනි ප්‍රවීණයෝ එදා පාර්ලිමේන්තුව නියෝජනය කළහ. ජාත්‍යන්තරය පවා එදා අපේ පාර්ලිමේන්තුව දෙස විශාල උනන්දුවකින් සහ ආශාවකින් බලා සිටියහ. එකල ගැමියන් පාර්ලිමේන්තු ගමන හැඳින්වූයේ 'කවුන්සිලයට යනවා' යනුවෙනි. ඒ තරමට ඊට විශාල පිළිගැනීමක්, ගෞරවයක් තිබිණ. 1960 – 1970 කාල සීමාවේ පැවැති පාර්ලිමේන්තු සභාවන්හී දී පැවැති ඒ සාරගර්භ වාද විවාදයන්ට මම ද සවන් දී ඇත්තෙමි.



නමුත් අද තත්ත්වය හාත්පසින්ම වෙනස් ය. අද ජනතාව පාර්ලිමේන්තුව දෙස බලන්නේ පිළිකුල් සහගත හැඟීමකින් යුක්තව ය. පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 'ජෝකර්ලා', 'චණ්ඩි මල්ලිලා' ලෙස හඳුන්වනු ලබති. අවසානයේ දී 'පාර්ලිමන්ට් ජෝක්ස්' යනුවෙන් චිත්‍රපටයක් පවා නිර්මාණය වූයේ පාර්ලිමේන්තු සම්ප්‍රදාය හාස්‍යයට ලක් කරමිනි. ඇතැම් අවස්ථාවල පාර්ලිමේන්තුව ට පිවිසීමේ දී මේ කුමන විහිළුවක්දැයි මසිතට නැගේ. එදා ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ නගරය සැලසුම් කිරීමේ දී පාර්ලිමේන්තු සංකීර්ණය මෙන් ම ඊට දෙපසින් පරිපාලන ගොඩනැගිලි දෙකක් ද නිර්මාණය විය. ඉන් එකක් වූයේ රණසිංහ ප්‍රේමදාස මහතාගේ අමාත්‍යාංශයට අයත් වූ සෙත්සිරිපාය ය. අනෙක අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් ඉසුරුපාය ය. එදා ජනතාව හාස්‍යයෙන් යුතුව කීවේ පසෙකින් සෙත්සිරිපාය, තවත් පසෙකින් ඉසුරුපාය පිහිටා තිබියදී ඊට මැද 'අපාය' පිහිටුවා ඇති බව ය. අද එය සත්‍යයක් බවට පත්ව ඇත. මෙලෙස පරිහානියට පත්වූ දේශපාලනය වෙනස් කිරීමට නම් බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළ අපරිහානි ධර්මය වර්තමානයට ගලපා නව දේශපාලන ක්‍රමයක් සකස් කළ යුතු ය.

මෙහිදී මගේ මතකයට නැගුණේ සිංගප්පූරුවේ හිටපු අගමැති ලී ක්වාන් යූ මහතා කළ සඳහනකි. *"ප්‍රජාතන්ත්‍රවාදී රටක දේශපාලන ක්‍රමය සකස් විය යුත්තේ රටේ මූලික පරමාර්ථ ඉටුකොට රට ඉදිරියට ගෙන යාමට ය. එසේ නොමැතිව දේශපාලකයන්ගේ අවශ්‍යතාවයන් අනුව රට පාලනය කිරීමට නොවේ."* අද එය සත්‍යයක් බව මට සිතේ. අප නිරන්තරව නගන ප්‍රශ්නය වන්නේ එංගලන්තය, යුරෝපා රටවල මෙන් දියුණු දේශපාලන ක්‍රමයක් ලංකාවේ ගොඩනැගිය නො හැක්කේ මන්ද යන්න ය. රජයන් වෙනස් වුව ද, ආණ්ඩු වෙනස් වුව ද, ඇමැතිවරු වෙනස් වුව ද නො වෙනස් වන පිළිගත් අරමුණු හා මූලධර්ම මත සකස් කළ දේශපාලන ක්‍රමයක් ඒ සඳහා පැවතිය යුතු ය. එය සකස් කළ යුත්තේ කරුණු ගණනාවක් පිළිබඳ මූලික ප්‍රතිපත්තියක් සකස් කිරීමෙන් අනතුරුව ය.

## ජාතික පිළිගැනීම ලැබූ අරමුණු හා මූලධර්ම

බොහෝ රටවල් දියුණු වූයේ මූලික පදනමක් ඇතිව ය. ඊට වසර 25 ක්, 50 ක් ගත වූ බව සැබෑ ය. එම දියුණු වීමේ රාමුව අප සතුව පැවතුණ ද ඉන් ප්‍රයෝජන ගැනීමට අපි අසමත් වුනෙමු. එම නිසා එකී දියුණුව කරා ශීඝ්‍රයෙන් ගමන් කිරීමට දැන් අපට හැකි ද යන්න ගැටලුවකි. නමුත් කෙසේ හෝ අප එය ඉටු කරගත යුතු ය. එදා බුදුරජාණන් වහන්සේ විසින් ලිච්ඡවී රජදරුවන්ට දේශනා කොට වදාළ සප්ත අපරිහානි ධර්ම අපට පදනම් කර ගැනීමට පුළුවන. බුදුරජාණන් වහන්සේ ලිච්ඡවී රජ දරුවන්ට දේශනා කළේ නිතර ම සමගියෙන් රැස්ව, සමගියෙන් කතා බහ කොට, සමගියෙන් විසිර යා යුතු ය; රටේ පවත්නා මූලධර්ම අනුව කටයුතු කළ යුතු ය; පෙර නම පරපුරෙහි නො පනවන ලද්දක් නො පැනවිය යුතු ය; පනවන ලද්ද අහෝසි නො කළ යුතු ය; පනවන ලද මූලධර්ම මත පිහිටා කටයුතු කළ යුතු ය; වැඩිහිටියන්ට ගරු කළ යුතු ය; යනාදී වශයෙන් ය. එමෙන් ම එක් පුද්ගලයෙක් යටතේ බිහිවන පාලනයකට විකල්පයක් වශයෙන් පුළුල් සමූහාණ්ඩු ක්‍රමයක් තිබිය යුතු බවත් බුදුරජාණන් වහන්සේ ලිච්ඡවී රජදරුවන්ට දේශනා කළ සේක.

මේ කරුණු වත්මන් දේශපාලනයට ද අදාළ ය. විටින් විට රැස්වී තීරණ ගැනීම යනු ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක මූලික ලක්ෂණයකි. එය පාර්ලිමේන්තුව, පළාත් සභා, ප්‍රාදේශීය සභා සහ ඇමැති මණ්ඩල හරහා සිදු කළ හැක. මෙසේ සමගියෙන් රැස්වීමටත්, සමගියෙන් සාකච්ඡා කිරීමටත්, සමගියෙන් විසිර යාමටත් කරුණු තුනක් ඉටු වී තිබිය යුතු ය. පළමුවැන්න මහත්මා දේශපාලනය යි. දෙවැන්න හරි වැරදි පිළිබඳ ඇති දැක්ම යි. තුන්වැන්න දේශපාලන මූලධර්ම පිළිබඳ පොදු එකඟත්වයක් ඇති පදනම යි. මේවා කඩිමුඩියේ වෙනස් කළ නො හැක. ඊට වෙනස්කම් එක් කරනවා නම් සියල්ලන් සමඟ සාකච්ඡා කළ යුතු ය.

අද ස්කැන්ඩිනේවියානු රටවල්, ජර්මනිය සහ ජපානය වැනි රටවල් මේ හා සමාන ක්‍රමයන් ක්‍රියාත්මක කිරීම හරහා අන්තවාදී දේශපාලන ගැටුම් වළකාගෙන ඇත. මුළු සමාජය ම පිළිගන්නා නිශ්චිත අගයන් ගණනාවක් මත පදනම්ව මෙම ක්‍රමයන් සකස් කොට තිබේ. ප්‍රජාතන්ත්‍රවාදය, සියලු ජනකොටස් අතර සමානාත්මතාවය, දුප්පත්කම තුරන් කිරීම පිළිබඳව සහයෝගීතාවයක් ද ඊට ඇතුළත් වේ. අප ද එවැනි ක්‍රමයක් වෙත ගමන් කළ යුතුය.

මෙය යථාර්ථයක් බවට පත් කරගත හැක්කේ,

1. සමාජ ක්‍රමය, දේශපාලන ක්‍රමය හා ආර්ථික ක්‍රමයේ මූලධර්ම පිළිබඳ සම්මුතියක් ඇති කොට මේ මූලධර්ම ක්‍රියාත්මක කිරීම සඳහා දේශපාලන පක්ෂ විසින් විකල්ප වැඩසටහන් හා ඒවා ක්‍රියාත්මක කිරීමට සුදුසු අපේක්ෂකයන් මැතිවරණවල දී ජනතාවට ඉදිරිපත් කිරීම හරහා ය.

2. මෙමගින් බහුපක්ෂ ක්‍රමය තුළ අවම ගැටුම්කාරී පසුබිමක් තුළ බලය ක්‍රියාත්මක කිරීමට දේශපාලන පක්ෂවලට පුළුවන.

මෙම රටවල් බුදුරජාණන් වහන්සේ අපරිහානි ධර්මය පිළිබඳව කළ දේශනා පදනම් කොටගත් ක්‍රමවේදයක් සාර්ථකව ක්‍රියාත්මක කළ හැකි බව පෙන්වා දී ඇත. එවැනි ක්‍රමයක් ශ්‍රී ලංකාවේ

වත්මන් දේශපාලන ක්‍රමය තුළ ක්‍රියාත්මක කළ නො හැකි බැවින් ව්‍යවස්ථාව සහ දේශපාලනය යන දෙක ම වෙනස් කිරීමට අප කටයුතු කළ යුතු ය.

## අලුත් ව්‍යවස්ථාවක්

ශ්‍රී ලංකාව දැනට ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා තුනක් අත්හදා බලා ඇත. එහෙත් රටක් වශයෙන් ශ්‍රී ලංකාව තවමත් අසාර්ථක ය. සමහරු එය ව්‍යවස්ථාවේ වරදක් ලෙස දකිති. තවත් සමහරු ක්‍රමයේ වරදක් සේ දකිති. ඇතැම්හු දේශපාලනඥයන්ගේ වරදක් සේ දකිති. කෙසේ වෙතත් කොතැන හෝ වරදක් සිදු වී තිබේ. එම වරද නිවැරදි කළ හැකි එක් ප්‍රධාන මාර්ගයක් වන්නේ ව්‍යවස්ථාව ය. රටක ව්‍යවස්ථාවක් තිබිය යුත්තේ ජනතාව වෙනුවෙනි. නමුත් අද සිදුවන්නේ ජනතාවගේ ප්‍රයෝජනය වෙනුවෙන් ව්‍යවස්ථාව ප්‍රයෝජනයට ගැනීම නොව බලය ආරක්ෂා කර ගැනීම උදෙසා ව්‍යවස්ථාව ප්‍රයෝජනයට ගැනීම ය. මෙම තත්ත්වය වෙනස් කිරීමට නම් බලය රැක ගැනීම නොව ජනතාව රැක ගැනීම මූලික කොට ගත් ව්‍යවස්ථාවක් සකස් කළ යුතු ය. බලයෙන් මත් වී අත්තනෝමතික ලෙස දේශපාලඥයන් ක්‍රියා නො කළ යුතු ය යන පදනම මත පිහිටා නව ව්‍යවස්ථාවක් සකස් කළ යුතු ය. එහිදී රජයේ ප්‍රධානියා සහ විධායකයේ ප්‍රධානියා යන තනතුරු දෙක ම, එක් පුද්ගලයෙක් යටතේ නො පැවතිය යුතු ය.

01 රජයේ ප්‍රධානියා ලෙස ජනාධිපතිවරයාගේ කාර්යභාරය ව්‍යවස්ථාව ආරක්ෂා කිරීමත්, අපරිහානි දේශපාලන ක්‍රමය ආරක්ෂා කිරීමත් ය. ජනාධිපතිවරයා තෝරා ගැනීමේ ක්‍රමය සියලු දේශපාලන පක්ෂ සමඟ සාකච්ඡා කොට තීරණය කළ හැකි ය.

02 අගමැති ධූරය තුළින් විධායක බලතල ක්‍රියාත්මක කෙරේ. අගමැතිවරයා නීතියට යටත්ව ක්‍රියා කළ යුතු ය. පාර්ලිමේන්තුවට වගකිව යුතු ය. නමුත් අගමැතිවරයා තම පක්ෂයේ එදිනෙදා දේශපාලන කටයුතුවලට සහභාගී වීම නො කළ යුතු ය. අගමැතිවරයාට සිය ධූරය දැරිය හැක්කේ දෙවතාවක් පමණි. පාර්ලිමේන්තු මැතිවරණයේදී ම අගමැතිවරයා ද තෝරා පත් කර ගැනේ.

03 පාර්ලිමේන්තුවට නියෝජිතයන් තෝරන මැතිවරණයත්, අගමැතිවරයා තෝරන මැතිවරණයත්, පළාත් සභා, ප්‍රාදේශීය සභා සහ නගර සභා යන මැතිවරණත් එක ම දිනක දී පැවැත්වෙනු ඇත. මෙම නියෝජිත ආයතනවල ධූර කාලය නීතියෙන් ම වසර 5 කට සීමා කෙරෙනු ඇත.

04 අමාත්‍ය මණ්ඩලය ව්‍යවස්ථාවෙන්ම 22 කට සීමා කෙරේ. අමාත්‍යාංශය, විෂයන් සහ ඊට අදාළ ආයතන පාර්ලිමේන්තු නීති මාර්ගයෙන් තීරණය කෙරේ. මෙහිදී අගමැතිවරයාගේ අභිමතය පරිදි අමාත්‍යාංශ විෂයන් මාරු කළ නො හැක. කෙසේවෙතත් අද ඇති 110 කට ආසන්න අමාත්‍යාංශ ගණන එකවර 22 දක්වා අවම කිරීම ප්‍රායෝගිකව අපහසු වන නිසා ඊට යම් සාධාරණ කාල සීමාවක් ගතවිය හැක. එය අන්තර් පාලන කාලයක් ලෙස සලකා එම කාලය තුළ ඇමැතිවරු, නියෝජ්‍ය ඇමැතිවරු ප්‍රමාණය පාර්ලිමේන්තු මන්ත්‍රී සංඛ්‍යාවෙන් 1/3 කට සීමා කෙරෙනු ඇත.

05 මහඇමැතිවරු සහ නීතියෙන් නම් කරන අනෙකුත් සාමාජිකයන්ගෙන් සමන්විත රාජ්‍ය සභාවක් අගමැතිවරයාගේ ප්‍රධානත්වයෙන් ඇති කෙරේ. එහි එකඟත්වය මත රටේ මූලික ජාතික ප්‍රතිපත්ති සකස් කෙරේ. රටේ මැදිකාලීන හා දිගුකාලීන සැලසුම් අනුමත කිරීම මෙ රාජ්‍ය සභාව මගින් සිදුකෙරේ. ඒවා ක්‍රියාත්මක වන්නේ කැබිනට් මණ්ඩලය හා පළාත් ඇමැති මණ්ඩල මගිනි.

06 ආණ්ඩුකාර තනතුර අහෝසි කෙරේ. මහඇමැතිවරු ජනාධිපතිවරයාට වගකිව යුතු ය. ඒ පිළිබඳව ජනාධිපතිවරයා අගමැතිවරයාගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

07 රටේ ආර්ථික, සමාජයීය, ආගමික ක්ෂේත්‍ර නියෝජිතයන් රාජ්‍ය පාලනයට සම්බන්ධ කර ගැනීමේ යාන්ත්‍රණයක් ලෙස සමාජ ආර්ථික සභාවක් ව්‍යවස්ථාවට ඇතුළත් කෙරේ. මේ සභාවේ කාර්යභාරය වනුයේ නීති හා ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ දී පාර්ලිමේන්තුවට, රාජ්‍ය සභාවට සහ ඇමැති මණ්ඩලයට ඒ පිළිබඳ උපදෙස් දීම ය.

## ක්‍රමය වෙනස් කිරීම

පවත්නා දේශපාලන ක්‍රමය වෙනස් නො කර ලංකාව වෙනස් කළ නො හැකි ය යන්න පොදු මතයක් බවට පත්ව ඇත. දේශපාලනය සේ ම දේශපාලඥයින් ද වෙනස් කිරීමට නම් පවතින ක්‍රමය වෙනස් කළ යුතු ය යන්න සත්‍යයකි. ඇතැමුන් සිතන්නේ පවතින ව්‍යවස්ථාව වෙනස් කොට අලුත් ව්‍යවස්ථාවක් ක්‍රියාත්මක කිරීමෙන් පමණක් මෙම ක්‍රමය වෙනස් කරගත හැකි බවකි. දැනට අප ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා කිහිපයක් වෙනස් කොට තිබුණ ද ක්‍රමයේ කිසිදු වෙනසක් සිදුව නොමැත. සිදුවී ඇත්තේ ක්‍රමය ක්‍රියාත්මක කිරීමට ව්‍යවස්ථාව ප්‍රයෝජනයට ගැනීම පමණි. එම නිසා රට ගොඩනගා වෙනසක් ඇති කිරීමට නම් නව ව්‍යවස්ථාවක් පමණක් නොව නව දේශපාලන ක්‍රමයක් ද අත්‍යවශ්‍ය ය.

ප්‍රජාතන්ත්‍රවාදය දූෂණය කිරීමට කටයුතු කිරීම තහනම් බවට වගන්තියක් ජර්මනියේ ව්‍යවස්ථාවට ඇතුළත් කර තිබෙනු මා දුටුවේ ජර්මනියට ගිය අවස්ථාවකදී ය. ඒ පිළිබඳ ඔවුන්ගෙන් විමසූ විට දැනගන්නට ලැබුණේ ජර්මනියෙහි හිටපු අධිපතිවාදී නායක හිට්ලර් නිදහස් ඡන්දයකින් බලය අත්පත් කරගෙන අනතුරුව ප්‍රජාතන්ත්‍රවාදය වළලා දැමීමට කටයුතු කළ නිසා ඔවුන්ගේ නව දේශපාලන ක්‍රමයේ මූලික සිද්ධාන්තයක් ලෙස 'ප්‍රජාතන්ත්‍රවාදය අඩපණ කිරීම සඳහා ප්‍රජාතන්ත්‍රවාදය පාවිච්චි කළ නො හැක' යනුවෙන් වූ වගන්තියක් ව්‍යවස්ථාවට ඇතුළත් කළ බව ය.

නිදහස ලබා ගැනීමත් සමඟ ඉන්දියාව ද නව දේශපාලන ක්‍රමයක් සකස් කොට ගත්තේ ය.

කෙසේ වෙතත් නව ව්‍යවස්ථාවක් ඉදිරිපත් කළ ද පැරණි ගර්හිත දේශපාලන ක්‍රමය තුළ තවදුරටත් අප රැඳී සිටියහොත් ඉන් අපේක්ෂිත ප්‍රතිඵල ලබාගත නො හැක. නව ව්‍යවස්ථාවක් මෙන් ම නව ක්‍රමයක් ද අවශ්‍ය වනුයේ එහෙයිනි.

අපරිහානි දේශපාලනය සාර්ථක කර ගැනීමේ දී දේශපාලන ස්ථාවරභාවය ඇති කිරීමටත්, පිරිහුණු පුද්ගලයන් දේශපාලනයට රිංගෙන ඒම වැළැක්වීමත් අප කටයුතු කළ යුතු ය. එහිදී නීතිගරුක, විනයගරුක පුද්ගලයන්ට දේශපාලනයට පැමිණීමේ අවස්ථා විවර කළ යුතු ය. දේශපාලන පක්ෂ සුදුසු පුද්ගලයන් මැතිවරණවලට ඉදිරිපත් කළ යුතු ය. ජාතික ප්‍රතිපත්තිය පිළිබඳව, මූලධර්ම පිළිබඳව එකඟත්වයකින් යුතුව ක්‍රියාත්මක වීමට ඔවුන්ට හැකි විය යුතු ය.

දේශපාලන පක්ෂ හා සිවිල් සංවිධාන එක්රැස් කොට මෙම නව දේශපාලන ක්‍රමය ඉතා කෙටි කාලයකින් නිර්මාණය කළ යුතුව ඇත. දේශපාලන පක්ෂවල අභ්‍යන්තරය විනිවිද භාවයකින් යුතුව පිරිසිදුව ක්‍රියාත්මක වීම සඳහා නිශ්චිත නිර්ණායකයන් හා පිළිගත් රීති මත පිහිටා සුදුසු ක්‍රමවේදයක් සැකසිය යුතු ය. දේශපාලන පක්ෂ වැඩ කටයුතු සඳහා පාර්ලිමේන්තුව හරහා මුදල් ලබා දීමේ නීතියක් ඇති කොට දේශපාලන පක්ෂ කිසිවෙකුගේ හෝ අයුතු බලපෑම්වලට යට වීමේ ක්‍රමයට තිත තැබිය යුතු ය. ඒ හරහා දේශපාලන පක්ෂවල අභ්‍යන්තර පාලන කටයුතු පිළිබඳ රටට හා පාර්ලිමේන්තුවට ඇනුම් දිය හැකි ය. මේ පිළිබඳ දේශපාලන පක්ෂ වෙන ම මණ්ඩලයකට වාර්තා කළ යුතු ය.

දේශපාලන රාමුව අධීක්ෂණය කිරීම සඳහා බලය ලත් දේශපාලන ක්‍රම අධීක්ෂණ මණ්ඩලයක් ඇති කෙරේ. දේශපාලන පක්ෂ තම සියලු ක්‍රියා එම දේශපාලන ක්‍රම අධීක්ෂණ මණ්ඩලයට වාර්තා කළ යුතු අතර ඊට දේශපාලන පක්ෂ නියෝජිතයන්ට අමතරව සිවිල් සංවිධාන නියෝජිතයන් ද ඇතුළත් කරනු ලැබේ. එවිට ගැටුමකින් තොරව අපරිහානි දේශපාලන ක්‍රමය ක්‍රියාත්මක කිරීමට පුළුවන.

### දූෂණය නැති කිරීම

ජනතාවට දේශපාලනය එපා වීමට එක් ප්‍රධාන හේතුවක් නම් දේශපාලන ක්ෂේත්‍රය පුරා පැතිර පවතින අල්ලස හා දූෂණය යි. ජනතාව සිතන්නේ කවුරුන් හෝ දේශපාලනයට පිවිසෙන්නේ සොරකම් කිරීමට යැයි කියා ය. සොරකම නැති කිරීම කිසිදු ආණ්ඩුවකට කළ නො හැකි බවටත්, එය දේශපාලඥයන්ගේ ඇඟේ ම ඇති දෙයක් බවටත් ඔවුහු චෝදනා කරති. මේ චෝදනාවේ සත්‍යයක් නැතුවා නො වේ.

අතීතයේ දී යම් මන්ත්‍රීවරයෙක් රුපියල් 500 ක් 1000 ක් වැනි මුදලක් අයථා ලෙස ගත් පමණින් එම මන්ත්‍රීවරයාව අල්ලස් චෝදනා යටතේ මන්ත්‍රීකමින් ඉවත් කිරීමේ ක්‍රමවේදයක් පැවතිණ. නමුත් අද හැමතැනම දූෂණය රජ වී ඇත. විධායකයට ද දූෂණ චෝදනා එල්ල වී තිබේ. අල්ලස් දූෂණ පිළිබඳ නීති පැවතිය ද ඒවා නිසි අයුරින් ක්‍රියාත්මක නො වේ. එම නිසා ඇතැම්හු රිසි පරිදි දූෂණයේ නියුතුව සිටිති. වහා ම මෙම ක්‍රියාවන්ට නැවතීමේ තිත තැබිය යුතු වෙමු.

දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය ශ්‍රී ලංකාවේ නීතිගත කළ යුතු ය. මෙය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය යාන්ත්‍රණය සකසා ගැනීම සඳහා ලොව දූෂණය මැඩපවත්වා ඇති ප්‍රමුඛ පෙළේ රටක් ආදර්ශයට ගැනීමට කටයුතු කළ හැකි ය. අපට ආධාරයක් ලෙස එම යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පුද්ගලයන් පුහුණු කර දෙන ලෙස ඔවුන්ගෙන් ඉල්ලා සිටිය යුතු ය. කිසිදු අභියෝගයකට යටත් නො වන, කිසිවෙකුට බිය නොමැති පුද්ගලයන් මේ සඳහා අනුයුක්ත කළ යුතු ය. ඊට සමාන්තරව ආණ්ඩුවේ යාන්ත්‍රණය තුළ විනිවිදභාවය තහවුරු කෙරෙන ක්‍රමවේදයක් ද ඇති කළ යුතු ය.

## බහුජන හිතාය බහුජන සුඛාය ආර්ථිකය

දුප්පත්කම උත්පත්තියෙන් රැගෙන එන දෙයක් යැයි සිතන අය තවමත් අපේ ගම්වල සිටිති. මෙය අපේ ලැබීම, කරුමය යැයි සිතා සැනසෙන අය ද නැතුවා නො වේ. තවත් සමහරු දේශපාලඥයන් දුප්පත්කම නැති කරන බවට සුරංගනා කතා කියා බලයට විත් බඩ වඩා ගන්නා බවට දොස් කියති. ආණ්ඩුවක් මොන තරම් හොඳට ආර්ථිකය මෙහෙයවුවත් එහි ප්‍රතිපල ලබන්නේ සුළු කොටසකි. එහි පල නො ලබන බහුතරයක් වූ අහිංසක දුප්පත් ජනතාව දේශපාලඥයන් විසින් තම දේශපාලන වුවමනාවන් සපුරා ගැනීමට භාවිතා කරනු ලබයි. දුප්පත්කම යනු බලය ගැනීම සඳහා විකිණිය හැකි හොඳ දේශපාලන ආයුධයකි. දුප්පත්කම අවම කර ගත හැක්කේ ආර්ථික සංවර්ධනයේ ප්‍රතිපල බෙදී යාමේ විෂමතාවය පාලනය කළ හැකි ක්‍රමයක් නිර්මාණය කර ගැනීමෙනි.

බුදුරජාණන් වහන්සේ දේශනා කළ *'බහුජන හිතාය බහුජන සුඛාය'* යන ධර්මය මත පදනම් වූ සැමට හිත සුව පිණිස වූ ආර්ථිකයක් ගැන මා සිතන්නට පටන් ගත්තේ මෙම කරුණු හොඳින් සැලකිල්ලට ගෙන ය.

ලෝකයේ වෙළෙඳ ආර්ථිකය වර්ධනය වන්නේ ඊජිප්තු, ආසියානු කලාපය තුළ ඉතා අනාදිමත් කාලයක සිට ය. කර්මාන්ත විප්ලවයත් සමග බටහිර න්‍යාය ධර්මයට මුල් තැන හිමිවිය. එම න්‍යාය ධර්මවල හැඩගැස්මට අනුව ධනවාදී, මාක්ස්වාදී, සමාජවාදී හා සුබසාධන රාජ්‍යය බිහි විය. සමස්ත ලෝකය ම විශාල විපර්යාසයකට යොමුවුණේ මේ න්‍යාය ධර්මයන් හේතුකොටගෙන ය.

1990 දශකයේ කොමියුනිස්ට්වාදය කඩා වැටීමත් සමග ඉදිරියට පැමිණියේ අමෙරිකාව, අයි.එම්.එෆ්. සංවිධානය හා ලෝක බැංකුව එක්ව සකස් කළ වොෂින්ටන් සම්මුතියයි. එහි පදනම වූයේ කිසිදු පාලනයකින් තොරව ලෝක මූල්‍ය වෙළෙඳපොළේ අවශ්‍යතාව අනුව ආයෝජනය හා සංවර්ධනය විය යුතු ය යන මූලධර්මයට ප්‍රමුඛතාවය ලබා දීම ය. මෙහි අරමුණ අන් අයගේ ප්‍රාග්ධනය හරහා තමන්ගේ ලාභය කෙටි කාලයකින් උපරිම කර ගැනීම ය. සංවර්ධන ප්‍රමුඛතා සඳහා ආයෝජනය ලබා දීම නො වේ.

අවසානයේ ලංකාව වැනි රටවල් මීට හසුව සීමාරහිතව දේශීය හා විදේශීය වාණිජ ණය ලබා ගැනීමට යාමෙන් සිදුවූයේ මේ ණය ආපසු ගෙවා ගත නො හැකි තත්ත්වයකට පත්වීම ය. මෙවැනි ක්‍රමයක් වැඩිකල් රැගෙන යාමට නො හැක. වසර 77 කින් අනතුරුව ලෝකයේ බැංකු, මූල්‍ය ආයතන හා කොටස් වෙළෙඳපොළ ආදිය කඩා වැටුණේ මේ හේතුව නිසා ය.

2008 වසරේ දී සිය නත්තල් දේශනයේ දී කැන්ටබරිහි අගරදගුරු ආචාර්ය රොවන් විලියම්ස් තුමා මේ ගෝලීය ආර්ථික අර්බුදයට පෞද්ගලික අංශයේ සමහරුන්ගේ අධික තණ්හාව හේතු වූ බව කියා සිටියේ ය. අවුරුදු 2500 කට පෙර බුදුරදුන් දේශනා කළේ අසීමාන්තික කෑදරකම් පදනම් කරගත් ඕනෑම ක්‍රමයක් විනාශ මුඛයට යන බව ය. එබැවින් ව්‍යවසාය ඉදිරියට ගෙන යාමටත්, ව්‍යාපාර සංවර්ධනය කරන්නටත් අවැසි ධනය ඉපැයීමේ නිවැරදි මාර්ගය බුදුන් වහන්සේ පෙන්වා දුන් සේක.

ධනය ඉතිරි කළ යුත්තේ අනාගත සංවර්ධනයටත්, අනාගත අලාභවල දී ප්‍රයෝජනයට ගැනීමටත්, තම දරුවන්ට හොඳ ජීවිතයක් ලබා දීමටත් ය. මීට වඩා වැඩි ධනයක් තමන් සන්තකයේ පවතින්නේ නම් එය දුප්පතුන්ට, ප්‍රජා වැඩකටයුතුවලට, පූජ්‍ය පක්ෂයට සහ ආගමික වැඩසටහන්වලට උපයෝගී කර ගත යුතු ය.

බුදුන් වහන්සේ රටේ ආර්ථිකය සැකසීමේ දී පාලකයාගේ කාර්යභාරය හා යුතුකම පිළිබඳව 'කූටදන්ත සූත්‍රය' මගින් වදාළ සේක. උන්වහන්සේ එහිදී ප්‍රධාන කරුණු දෙකක් වදාළහ. *"රටක පිරිහීමට හේතුව දුප්පත්කමයි. එහෙයින් පාලකයින් විසින් කළ යුත්තේ දුප්පත්කම තුරන් කිරීමයි..."* යන්න එක් කරුණකි. *"ගොවිතැනින් හා ගව පාලනයෙන් දිවි ගෙවන අයට බීජ ලබාදීම, වෙළෙඳාම් කරන අයට ඒ සඳහා අවශ්‍ය මුදල් ලබාදීම, රජයේ සේවකයන්ට නිසි වැටුප්, ආහාර හා නිවාස සැපයීම පාලකයන්ගේ වගකීමක්"* බව අනෙක් කරුණයි. රටේ පාලකයා කළ යුත්තේ දුප්පත්කම නැති කිරීමටත්, ජනතාවට ජීවන මාර්ග ඇති කිරීමටත් පියවර ගැනීම ය. තරඟකාරී වෙළෙඳ ආර්ථිකය තුළ සාර්ථක වූවන් විසින් අසාර්ථක වූවන් රැකබලා ගැනීමේ ක්‍රමවේදයක් පෙන්වා දුන්නේ බුදුන් වහන්සේ ය. මෙය අදටත් වලංගුය. 'මයික්‍රොසොෆ්ට්' ආයතනය බිහි කළ අමෙරිකාවේ බිල් ගේට්ස්, 'ඉන්ෆොසිස්' සමාගම බිහි කළ ඉන්දියාවේ නාරායන මූර්ති වැනි ලොව ප්‍රකට ධනාධිපතියන් සමාජ සාධාරණත්වය සඳහා සිය ධනයෙන් වැඩි කොටසක් සමාජ සේවා භාරකාර අරමුදල්වලට පරිත්‍යාග කරනුයේ මේ නිසා ය.

නවීන ආර්ථික න්‍යාය අනුව ධනය ජනතාව අතර බෙදාහරිනු ලබන්නේ බදු මාර්ගයෙනි. නමුත් බුදුන් වහන්සේ වදාළේ ඒ සඳහා බදු පමණක් නොව ස්වේච්ඡාවෙන් කරනු ලබන දානමානාදී පරිත්‍යාගයන් ද අවශ්‍ය බව ය. තණ්හාව අවම කිරීම මෙහි මූලධර්මය බව උන්වහන්සේ පෙන්වා දුන්හ.

සමාජ සාධාරණත්ව වගකීමක් ඇති සමාජ වෙළෙඳ ආර්ථිකයක් මීට සමාන ලක්ෂණ දරයි. විශේෂයෙන්ම ස්කැන්ඩිනේවියානු රටවල්, ජර්මනිය, ඔස්ට්‍රියාව, ජපානය වැනි රටවල් මෙවැනි ආකෘතීන් අනුගමනය කරන රටවල් වේ. අප ද මේ අනුව අපේ ආර්ථික රාමුව තවදුරටත් සකස් කළ යුතු ය.

සමාජ සාධාරණත්වය ඇති කිරීම සඳහා පහත සඳහන් ප්‍රතිපත්ති ඊට ඇතුල් විය යුතු ය. නිවාස, ඉඩම්, බැංකු ගිණුම්, කුඩා ව්‍යාපාර, කොටස්, වාහන, රිදී - රත්රන් ආභරණ වැනි චංචල සහ නිශ්චල දේපොළවල අයිතිය ජනතාව අතර පැතිරී යන අයුරින් ආර්ථිකය සකස් කළ යුතු ය. ආර්ථික සංවර්ධනය සඳහා රජයේ ව්‍යාපාර ද, පුද්ගලික ව්‍යාපාර ද, රජයේ හා පුද්ගලික ඒකාබද්ධ ව්‍යවසායන් ද අවශ්‍ය ය. කිසිදු විටක රටේ ව්‍යාපාරික අයිතිය හෝ ධනය සහමුලින් ම රජයට හෝ ව්‍යාපාරිකයන් සුළු පිරිසකට සීමා වීම වැළැක්විය යුතු ය.

ආර්ථික දියුණුවේ වාසිය අදාළ ව්‍යාපාරයන්හි සේවයේ නියුතු සේවක පිරිසට ද ලැබිය යුතු ය. අද සිදු වන්නේ සාර්ථක ව්‍යාපාරවල අසීමිත ලාභ එහි කොටස්කරුවන් හා කළමනාකරුවන් සුළු පිරිසක් අතරේ පමණක් බෙදී යාම හා ව්‍යාපාර අලාභ ලබද්දී එම අලාභයන් සේවකයන්ගේ කරමතින් යෑම ය. එබැවින් නිෂ්පාදන ඵලදායීතාවය හා තරගකාරිත්වය ඔස්සේ ලබා ගන්නා ලාභ සේවකයන්ටත් ලබාගත හැකි ක්‍රමයක් සකස් කළ යුතු ය. එවිට ව්‍යාපාරය සරු කාලයේ දී සේවකයන් සියල්ලන්ගේ ම ආදායම් තත්ත්වය ඉහළ යාම නිශ්චිතව ම සිදුවේ.

වර්තමානයේ දී සේවක අර්ථසාධක අරමුදලින් සහ සේවක භාරකාර අරමුදලින් රජය අඩු පොළියට මුදල් ලබා ගැනීමේ ප්‍රවණතාවක් පවතී. එම නිසා සේවකයා විශ්‍රාම යාමේ දී ඔහුට ලැබිය යුතු මුදලේ නියම වටිනාකම නො ලැබේ. අනෙක් අතට ව්‍යාපාරවල අයිතිකරුවන්ට තම මුදල් භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කොට වැඩි මුදලක් උපයා ගැනීමේ හැකියාව ද පවතී. එම තත්ත්වය අහෝසි කිරීමට නම් රජය සාධාරණ පොළියක් මත මේ අරමුදල්වලින් ණය ගැනීමේ ක්‍රමයක් ඇති කර විශ්‍රාම යන සේවකයාට ලැබෙන අර්ථ සාධක අරමුදලේ නියම වටිනාකම ආරක්ෂා කිරීමේ වැඩපිළිවෙළක් සකස් කළ යුතු ය.

ඉකුත් දශක දෙක තුළ මෙරට බැංකු හා මූල්‍ය සමාගම් ගණනාවක් කඩා වැටීමට ලක්වීම හේතුවෙන් ජනතාව තැන්පත් කළ ඉතුරුම් මුදල් ඔවුන්ට අහිමි විණි. එම නිසා බැංකු හා මූල්‍ය සමාගම් ඇතුළු සියලු මූල්‍ය ක්ෂේත්‍රයන් පාලනය කොට ජනතාවගේ ඉතුරුම් සුරක්ෂිත කිරීම සඳහා නව නීති සම්පාදනය කරලීම ද අත්‍යවශ්‍ය කරුණකි.

## ආර්ථික සැලැස්ම සහ ඉලක්ක

වසර 25 ක ආර්ථික සංවර්ධන යුගයේ අරමුණු සහ ඉලක්ක පැහැදිලිව ප්‍රකාශ කොට එම අරමුණු සහ ඉලක්කයන් සපුරා ගත හැකි ක්‍රියාමාර්ග ද ඇතුළත් ජාතික ආර්ථික සංවර්ධන සැලැස්මක් අප සකස් කළ යුතු ය. එම සැලැස්ම දශක දෙකහමාරක් පුරා අඛණ්ඩව රට පුරා ක්‍රියාත්මක කිරීමේ පස් අවුරුදු සැලසුම් 5 ක් අප සතුව තිබිය යුතු ය.

රටක ආර්ථික වර්ධන වේගය පමණක් පෙන්වන ආර්ථික සැලැස්මකින් ප්‍රයෝජන ලබන්නේ සුළු පිරිසකි. ව්‍යාපාරික සුළුතරයක් පමණක් සංවර්ධනය කරන ආර්ථික සැලසුමකින් ජනතාව සංවර්ධනය වන්නේ නැත. ආර්ථික සංවර්ධනයේ ප්‍රතිඵල ඍජුව ම සාමාන්‍ය ජනතාව අතට පත්වන ක්‍රමයකට ආර්ථික සැලසුම් සකස් කළ යුතු ය. මා මුලින් කීවා සේ *"බහුජන හිතාය බහුජන සුඛාය"* ආර්ථිකයක් නිර්මාණය වන්නේ එවිටය.

ජාතික ආර්ථික සැලැස්මේ මූලික ඉලක්ක වනුයේ,

1. ජනතාවගේ ජීවන තත්ත්වය අද සිටින යෞවනයන්ගේ ජීවිත කාලය ඇතුළත දැනට පවතිනවාට වඩා 50 ගුණයකින් ඉහළ නැංවීම.
2. ස්වශක්තියෙන් නැඟී සිටිය හැකි ආර්ථිකයක් ගොඩනැඟීම

3. සංවර්ධනයට වුවමනා අලුත් ප්‍රාග්ධන උපාය මාර්ග ඇති කිරීම

4. පළමු වසර දෙක තුළ ජනතාවට ඉක්මන් සහන ලබා දීම යනාදියයි.

ඒ සඳහා,

1. අපේ රටේ පිහිටීම හා මිනිස් සම්පත පූර්ණ ලෙස උපයෝගී කර ගැනීම සඳහා දැනුමින් පරිපූර්ණ, ක්‍රියාශීලී සහ තරඟකාරී වෙළෙඳ ආර්ථිකයක් ඇති කළ යුතු ය.

2. තිරසාර සංවර්ධනය පදනම් කරගත් ආර්ථිකයක් නිර්මාණය කළ යුතු ය. නිරන්තරයෙන් සිදුවන දේශගුණික විපර්යාසයන් හේතුකොටගෙන පරිසරය පමණක් නොව ලෝක ආර්ථිකයත්, සමාජයත් විශාල පරිහානියකට ලක්ව ඇත. තිරසාර සංවර්ධන ක්‍රමය යටතේ මෙම පරිසර හානිය අවම කරමින් දැවැන්ත ආර්ථික සංවර්ධනයක් ළඟා කර ගත හැකි ය. එපමණක් නොව මෙමගින්,

   - කෘෂිකර්ම ඉඩම්වල ඵලදායීතාවය දියුණු කර ගැනීම;
   - ජල සම්පත ආරක්ෂා කර ගැනීම;
   - ජනාවාස මීටත් වඩා ජීවයට හිතකර තත්ත්වයට පත්කර ගැනීම;
   - දියුණු ලෝකයේ පාරිභෝගික වෙළෙඳපොළට පාරිසරික ආරක්ෂක ක්‍රමවලින් නිෂ්පාදනය කරන භාණ්ඩ සඳහා නව වෙළෙඳපොළක් සහ නව අළෙවියක් නිර්මාණය කර ගැනීම;

   සාක්ෂාත් කරගත හැකි ය.

3. සියලු අංශ අන්තර්ගත සමාජ සුබසාධන ක්‍රියාවලියක් ස්ථාපිත කොට සෞඛ්‍යය, අධ්‍යාපන, නිවාස සඳහා වැඩි ආයෝජනයක් කළ යුතු ය. සමාජ ආරක්ෂණය පිළිබඳව පරිපූර්ණ ක්‍රමවේදයක් ද මීට ඇතුළත් වේ.

වේගවත් සංවර්ධනයක් කරා යාමට නම් අප චීනයේ වර්තමාන පිළිවෙත අනුගමනය කරමින් නවීකරණ ව්‍යාපාර පහක් ආරම්භ කළ යුතුය. එනම්,

- ආර්ථික නවීකරණය
- කෘෂිකාර්මික නවීකරණය
- කර්මාන්ත නවීකරණය
- සන්නිවේදන තාක්ෂණ නවීකරණය
- දැනුම නවීකරණය

මෙම පංච නවීකරණයන් මගින් රැකියා නිර්මාණය කළ හැකි අලුත් ආර්ථිකයක් සකස් කළ යුතු ය. එහිදී ආර්ථික නවීකරණය යටතේ රැකියා බිහි කිරීම සහ ආදායම වැඩිකිරීම, කර්මාන්ත නවීකරණය යටතේ රැකියා බිහිකරන වැඩපිළිවෙළක් සකස් කිරීම, කෘෂිකර්මාන්ත නවීකරණය යටතේ ග්‍රාමීය ආර්ථිකය ලොවට ආහාර සපයන ආර්ථිකයක් බවට පත් කරමින් රැකියා සහ ආදායම් මාර්ග ඇති කිරීමට කටයුතු කළ යුතුය. සන්නිවේදන තාක්ෂණ නවීකරණය සහ දැනුම නවීකරණය යටතේ ඩිජිටල් විප්ලවයක් තුළින් අලුත් රැකියා වෙළෙඳපොළක් ඇති කළ යුතු ය.

ඉදිරි වසර 25 තුළ ශ්‍රී ලංකාව ඉහළ වැටුප් ලබන ආර්ථිකයක් ලෙස පරිවර්තනය කිරීම මෙම ආර්ථික නවීකරණයේ පදනම විය යුතු ය. සියලු දෙනාට ම නිවාස අයිතිය, වාහන හිමිකම, අධ්‍යාපනය, දරුවන්ගේ අනාගතය යන සියලු කරුණු පූරණය කර ගැනීම සඳහා නිශ්චිත ආදායමක් හිමි විය යුතු ය. ඒ සඳහා අවම වශයෙන් මාසිකව රුපියල් 30,000 ක මුදලක් උවමනා ය. වසර

25ක් ඉක්මවන විට මෙය තවත් කිහිප ගුණයකින් ඉහළ නැංවෙනු ඇත. එම අරමුණු සාර්ථක කර ගැනීමට නම් අප වැඩි මිලක් ලබන කෘෂි භෝග වගා කිරීමත්, කර්මාන්ත භාණ්ඩ නිෂ්පාදනයත්, සේවා සැපයීමත් සිදු කළ යුතු ය. .

ගෝලීය ආර්ථිකය ඉදිරි වසර 25 ඇතුළත දෙගුණයකට වඩා වර්ධනය වීම සිදුවන්නේ ය. ආර්ථික අර්බුදය නිමාවීමෙන් පසු ගොඩනැගෙන එම ලෝකය තුළ වඩාත් ධනවත් කලාපයක් වන්නේ ආසියානු කලාපය ය. ජනාකීර්ණ ඉන්දියානු හා ආසියානු කලාපයේ මධ්‍යම පන්තිය ඉතා ශීඝ්‍රයෙන් දියුණු වෙමින් පවතී. අසල්වැසි ඉන්දියාවේ වෙළෙඳපොළ කෝටි 100 කි. දකුණු ඉන්දියාවේ පමණක් එය කෝටි 15 කි. ආසියානු කලාපයේ සහ චීනයේ වෙළෙඳපොළ කෝටි 200 ක පමණ අගයක් ගනී. එම නිසා භාණ්ඩ හා පාරිභෝගික සේවාවන්ට ඉදිරියේ දී වැඩි ඉල්ලුමක් බිහිවන්නේ මේ කලාපයේ ය. මෙම දියුණුවත් සමග සියලු ම භාණ්ඩ හා සේවාවන්ට ඇති පාරිභෝගික ඉල්ලුම දැනට පවතිනවාට වඩා අවම වශයෙන් 35% කින් ඉහළ යනු ඇත.

අද රැකියා විරහිත තරුණ තරුණියෝ ලක්ෂ ගණනාවක් නිවෙස්වලට වී නිකරුණේ කාලය ගත කරති. ඉකුත් වසර කිහිපය තුළ ආර්ථික සංවර්ධනයක් නොමැති වීම නිසා මෙම තත්ත්වය තවදුරටත් බරපතළ විය. ඔවුන් සඳහා රැකියා ලක්ෂ 2 ක් කෙටිකාලීනව බිහි කිරීමේ වැඩසටහන් වහා ඇති කළ යුතු ය. එයට රජයේ සහ පෞද්ගලික අංශයේ රැකියා ඇතුල් කළ යුතු ය. විදේශ රැකියා සඳහා තරුණ තරුණියන් විශාල පිරිසක් රජයේ අනුග්‍රහය යටතේ යොමු කළ හැක. ඇතැම් ග්‍රාමීය තරුණයන්ට ගමේ සංවර්ධනයට දායක විය හැකි රජයේ රැකියා අවස්ථා ද හිමි කර දිය යුතු ය. කෙටිකාලීන රැකියා බිහි කිරීමේ ප්‍රවර්ධන වැඩසටහන් රාජ්‍ය මැදිහත්වීම ඔස්සේ ආරම්භ කළ යුතු ය.

මේ ආර්ථික නවීකරණය සාර්ථක කර ගැනීම සඳහා අවශ්‍ය මූල්‍ය ධනය ලබා ගැනීමේ මාර්ග 3 ක් ඇත.

1. අලුත් රැකියා මාර්ග බිහි කරන, අලුත් තාක්ෂණය ලබා දෙන නව අපනයනයන් වෙළෙඳපොළ වෙත යොමු කරන සෘජු දේශීය හා විදේශීය ආයෝජනයන්ට ප්‍රමුඛත්වය ලබා දිය යුතු ය.


2. මිත්‍ර රටවල් හා ආයතන මගින් සැහැල්ලු කොන්දේසි මත ලැබෙන ණයවලට වැඩි ඉඩක් ලබා දිය යුතු ය. රටේ මූල්‍ය අස්ථාවරත්වය ඇති කෙරෙන කෙටිකාලීන ණය සඳහා කෙරෙන ඉල්ලුම් හා අධික පොලියට ලබා ගන්නා වාණිජ ණය සඳහා ප්‍රමුඛත්වය නො දිය යුතු ය.

3. දේශීය ඉතුරුම් තුළින් සංවර්ධනයට වුවමනා සම්පත් ලබා ගත යුතුය. චීනය, දකුණු කොරියාව හා ජපානය කළාක් මෙන් අපි ද දේශීය ඉතුරුම් උසස් තලයකට ගෙන ආ යුතු ය. අපේ ව්‍යාපාරයන්හි දියුණුව සඳහා අවශ්‍ය මුදල් ලැබෙන ප්‍රධාන මාර්ගය මෙයයි. ඒ හරහා අපට අයිති ව්‍යාපාර ඉහළ නංවා ගත හැකි ය.

## රැකියා ! රැකියා !! රැකියා !!! බිහිකිරීම<br>ආදායම් වැඩි කිරීම

සිංගප්පූරුව දියුණු කිරීමට උපදෙස් දුන් ඇල්බර්ට් විසුම්යස් ලංකාව පිළිබඳ සඳහන් කරමින් කීවේ *"සාගරයක් මැද වැදගත් නාවික මාර්ගයන් අසලින් ම පිහිටා ඇති ලොව එක ම රට වන්නේ ශ්‍රී ලංකාව"* බව ය. අප එමගින් ප්‍රයෝජන ගැනීමට දන්නේ නම් ලොව ප්‍රබල රටක් බවට පත්වනු ඇති බව හෙතෙම සඳහන් කළේ ය. එය සත්‍යයකි. ලංකාව පිහිටා තිබෙන්නේ ඉන්දියන් සාගරය

මධ්‍යයේ ය. 18 වන ශතවර්ෂය වනතුරු ලොව ධනවත් ම කලාපය වූයේ ඉන්දියන් සාගර කලාපයයි. යළිත් ඉන්දියන් සාගරය එම වැදගත්කම ලබමින් සිටියි. අද වන විට යුරෝපීය, ආසියානු මුහුදු මාර්ගවලට අමතරව අරාබි, අග්නිදිග ආසියානු, චීන, ජපාන යන රටවලට තෙල් ගෙන යන නාවික මාර්ග බොහොමයක් වැටී ඇත්තේ ශ්‍රී ලංකා මුහුදු සීමාව හරහා ය. මේ පිහිටීම නිසා අපට දකුණු ආසියාව, මැලේසියාව, සිංගප්පූරුව, ඉන්දුනීසියාව ඇතුළු අග්නිදිග ආසියාව ද, ජපානය, මැදපෙරදිග, දකුණු ඔස්ට්‍රේලියාව, දකුණු අප්‍රිකාව වැනි රටවල් මෙන් ම යුරෝපා වෙළෙඳපොළ ද, උතුරු අමෙරිකානු වෙළෙඳපොළ ද ග්‍රහණය කර ගත හැක.



අපේ දිවයිනේ මෙම වාසිදායක පිහිටීම අනුව ඉන්දියන් සාගරයේ ප්‍රධානතම ගුවන් සහ නාවික මධ්‍යස්ථානය බවටත්, ව්‍යාපාරික මධ්‍යස්ථානය බවටත්, පණිවුඩ හුවමාරු කිරීමේ මධ්‍යස්ථානය බවටත් ශ්‍රී ලංකාව පත් කළ යුතු ය.

## කර්මාන්ත නවීකරණය

අපට ඇත්තේ එක් විශාල කර්මාන්ත ක්ෂේත්‍රයක් පමණි. ඒ ඇඟළුම් කර්මාන්තයයි. අප ඒ මත පමණක් යැපීමට කටයුතු නො කොට ඉන් ඔබ්බට ගොස් කර්මාන්ත විවිධාංගීකරණයක් සඳහා වහා යොමු විය යුතු ය. නව කර්මාන්ත ක්ෂේත්‍ර වැඩි දියුණු කිරීමෙන් රැකියා අවස්ථා ලක්ෂ ගණනින් බිහි කිරීමේ හැකියාව අපට ඇත.

විදුලි උපකරණ, විද්‍යුත් භාණ්ඩ, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ කොටස් නිෂ්පාදනය ඉන් සමහරකි. අනාගත මධ්‍යම පාන්තික පාරිභෝගික ඉල්ලුමේ පදනම ඇත්තේ නව තාක්ෂණය පදනම් කොටගෙන නිපදවෙන භාණ්ඩ මත ය. අප එම නව තාක්ෂණික දැනුම ලබාගෙන එවැනි භාණ්ඩ නිපදවන කර්මාන්තශාලා ඇති කළ යුතුව ඇත.

මේ වනවිට ලෝක ආර්ථිකය අඩු කාබන් ආර්ථිකයක් බවට පරිවර්තනය වෙමින් පවතී. ගෝලීය පරිවර්තනයේ දී අඩු කාබන් භාණ්ඩ හා සේවාවන්ට වැඩි ඉල්ලුමක් ඇති වෙමින් තිබේ. මේ හේතුවෙන් ලංකාවත් අඩු කාබන් ආර්ථිකයක් බවට පරිවර්තනය කළ යුතු ය. අපේ කර්මාන්ත පසුබිම ද, රැකියාවන් ද, නිෂ්පාදන විධි ද, ජීවත් වන අන්දම ද යන සියල්ල ඊට අනුකූලව වෙනස් විය යුතු ය. ඒ සමග ම පරිසර හිතකාමී අඩු කාබන් භාණ්ඩ නිෂ්පාදනයේ යෙදිය යුතු ය.

මීට අමතරව,

- ලංකාව ඉන්දියන් සාගරයේ වාණිජ මධ්‍යස්ථානය බවට පත් කරලීමෙන් අනතුරුව මෙහි පැමිණෙන ගුවන් යානා සහ නැව් අළුත්වැඩියා කිරීමේ කටයුතු සිදු කළ යුතු ය.
- මේ සුවිශාල සංවර්ධනයේ දී ගොඩනැගිලි, යටිතල පහසුකම් අවශ්‍ය නිසා ඉදිකිරීමේ කර්මාන්තය දියුණු කිරීමට ද අපට පුළුවන.



### අපට වෙච්ච දේ

*1966-67 කාල සීමාවේ දී ඩඩ්ලි සේනානායක රජය මගින් ගත් පියවරයන් හේතුවෙන් ලංකාවේ 'මිට්සුබිෂි', 'මැස්ඩා' වාහන මෙන්ම 'ලේලන්ඩ්' ලොරි රථ නිෂ්පාදනය ද ආරම්භ කෙරිණි. මෙහි ඇති විශේෂත්වය වන්නේ ඒ වනවිටත් ඉන්දියාව තුළ ජපන් වාහන නිෂ්පාදනය ආරම්භ වී නො තිබීම ය. මලයාසියාවේ වාහන, ලොරි රථ නිෂ්පාදනය ආරම්භ වී නො තිබීම ය. නමුත් 1970 මුල් භාගය වනවිට එවකට තිබූ ආණ්ඩුවේ ප්‍රතිපත්ති හේතුවෙන් මේ කර්මාන්ත තුනම අඩපණ විණි. මලයාසියාව වාහන නිෂ්පාදනය ආරම්භ කළේ ද, ඉන්දියාව ජපන් වාහන නිෂ්පාතය ආරම්භ කළේ ද 80 දශකයේ දී ය. අද අපේ ඒ නිෂ්පාදනයන් සම්පූර්ණයෙන් ම කඩා වැටී තිබියදී ඉතදියාව සහ මලයාසියාව යන රටවල් දෙකම අප පසුකොට වේගයෙන් ඉදිරියට ගොස් ඇත.*

## සංචාරක ව්‍යාපාරයෙන් අලුත් රැකියා

ලෝක ආර්ථිකය දියුණු වද්දී වැඩි ආදායමක් ලැබෙන සංචාරක ව්‍යාපාරයක් ගොඩනගා ගත යුතු වෙමු. වර්තමානයේ දී ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයෙක් දිනකට වියදම් කරන්නේ අමෙරිකානු ඩොලර් 40 ක් හෝ 50 ක් පමණ සුළු මුදලකි. ඒ වෙනුවට දිනකට ඩොලර් 100 ක් හෝ 150 කට වඩා වැය කළ හැකි මට්ටමක සිටින සංචාරකයන් මෙරටට ගෙන්වා ගත හැකි ක්‍රමයක් අප සකස් කළ යුතු ය. එවිට සංචාරක හෝටල්වලට පමණක් නොව, ක්ෂේත්‍රයේ සිටින සියලු සේවා නියුක්තිකයන් හට හොඳ ආදායම තත්ත්වයක් ලබාගත හැක.



### සංචාරක කර්මාන්තය

*ව්‍යාපාරික මට්ටමින් ලංකාවේ සංචාරක කර්මාන්තය ආරම්භ වූයේ 1966 දී පමණ ය. මැලේසියාව, ඉන්දුනිසියාව, වැනි රටවල් සංචාරක කර්මාන්තය ආරම්භ කළේ අපට පසුව ය. අද වනවිට ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයන්ගේ සංඛ්‍යාව ලක්ෂ 5 කි. ඉන්දුනිසියාවේ ලක්ෂ 60 කි. මැලේසියාවේ ලක්ෂ 180 කි. ශ්‍රී ලංකාවට වසරකට පැමිණෙන සංචාරකයන්ට වඩා වැඩි ප්‍රමාණයක් මැලේසියාවේ ලංකාවි නම් කුඩා දූපතට පැමිණෙති.*

## සුළු හා මධ්‍යම ව්‍යාපාරවලට දිරිදීම

ජාතික ආර්ථිකයක් ගොඩ ගැනීමට සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ආරක්ෂා කිරීම අත්‍යවශ්‍ය කාරණයකි. අපේ රටේ එවැනි සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ලක්ෂ ගණනින් ව්‍යාප්තව පවතී. නමුත් ඔවුන් මුහුණ දෙන ප්‍රායෝගික ගැටළු සඳහා විසඳුම් නොමැත. දේශීය හා විදේශ බැංකු ඒ වෙනුවෙන් සිය අවධානය යොමු කොට නැත. මෙම ක්ෂේත්‍රවල සංවර්ධනය සඳහා අවශ්‍ය ප්‍රාග්ධනය අඩු පොළියක් යටතේ සැපයීම සිදු කළ යුතුව තිබේ. එසේ කිරීමට නම් මෙම ව්‍යාපාරවලට බැංකු ණය ලබා දීම සඳහා යම් ප්‍රතිශතයක් වෙන් කිරීමට හා එය නියෝග කිරීමට අවශ්‍ය බලතල රජය සතු විය යුතු ය.

## අළුත් විදේශ රැකියා

ශ්‍රී ලංකාව තුළ අලුතින් රැකියා බිහි නොවුණු නිසා ඉකුත් වසර කිහිපය තුළ දී ජනතාවට සිදුවූයේ විදේශ රටවල ඉතා සුළු මුදලක් යටතේ රැකියා සඳහා පිටත්ව යාමට ය. අපේ අරමුණ විය යුත්තේ

මසකට රුපියල් 50,000 කට වඩා වැඩි වැටුපක් ලැබෙන විදෙස් රැකියා සොයා ඒ සඳහා ඉල්ලුම් කරන්නන්ට පුහුණුව ලබා දී ඊට යොමු කිරීම ය. විදේශ රැකියා ක්ෂේත්‍රයේ නියම ප්‍රතිඵල අපට ලබා ගත හැක්කේ මෙවැනි වැඩසටහන් ක්‍රියාත්මක කිරීමෙනි.

## ලොවට ආහාර සපයන ග්‍රාමීය ආර්ථිකය

2005 වර්ෂයේ දී ලෝක ජනගහනය කෝටි 650 ක් විය. 2050 වනවිට ජනගහනය කෝටි 910 දක්වා ඉහළ නැංවෙනු ඇත. එය කෝටි 260 වර්ධනයකි. මින් කෝටි 50 ක් වර්ධනය වන්නේ දකුණු ආසියාවේ ය. ඒ හා සමානව ම දුප්පත් වීමේ ප්‍රතිශතය ද අවම වෙමින් පැවතීම නිසා ලෝක ආහාර ඉල්ලුම ශීඝ්‍ර වර්ධනයකට ලක්ව ඇත. 2050 වනවිට ආසියාවේ ආහාර ඉල්ලුම අද මෙන් දෙගුණයක් වන්නේ ය. එම ආහාර නිෂ්පාදනය සඳහා අවශ්‍ය නව තාක්ෂණය ද අද බිහිව තිබේ. මේ නිසා අප එම අලුත් ලෝකයේ බිහිවන ආහාර වෙළෙඳපොළ ඉලක්ක කොට කඩිනමින් ග්‍රාමීය ආර්ථිකයේ කෘෂි හා ධීවර ක්ෂේත්‍රයේ නවීකරණයන් ආරම්භ කළ යුතුව ඇත. සැලසුම් සහගත ආහාර නිෂ්පාදන ප්‍රවර්ධන වැඩපිළිවෙළක් මගින් සෞඛ්‍යදායී, නැවුම් ආහාර භෝග නිෂ්පාදනය කිරීම අපගේ ඉලක්කය විය යුතු ය. පෝෂ්‍යදායී, නැවුම් ආහාර සපයන ප්‍රමුඛ පෙළේ රටක් ලෙස ශ්‍රී ලංකාව ලොව පුරා ප්‍රචලිත විය යුතු ය. ඒ හරහා ගොවියන්ට සහ ධීවරයන්ට වැඩි ආදායම් උපයා ගැනීමට පුළුවන. නව රැකියා අවස්ථා ද බිහි කර ගත හැක.

**කෙන්යාව සහ තේ**



***නිදහස ලැබෙන අවස්ථාව වන විට ලෝක වෙළෙඳපොළට වැඩියෙන් ම තේ අලෙවි කළ රට වූයේ ශ්‍රී ලංකාව ය. නමුත් කෙන්යාව නිදහස දිනා ගැනීමෙන් අනතුරුව 60 දශකයේ සිට එරට තේ කර්මාන්තය දියුණු කිරීමට කටයුතු කළේ ය. මේ නිසා ඉකුත් වසර කිහිපය තුළදී ම ලෝක වෙළෙඳපොළට වැඩියෙන් ම තේ අලෙවි කළ රට බවට පත්වීමට කෙන්යාවට හැකි විය.***

ලංකාවේ පවතින්නේ කුඩා පරිමානයේ කෘෂිකර්මයකි. එවැනි පසුබිමක නවීකරණය සාර්ථක වන්නේ කුඩා ගොවිපොළවල විප්ලවයක් ආරම්භ කිරීමෙනි. එවිට සුළු ගොවියාට සාර්ථක ව්‍යාපාරිකයකු ලෙස ක්‍රියා කිරීමට අවශ්‍ය ශක්තිය ලැබේ.

- මේ සඳහා ගොවි සමුපකාර සමාගම් සංවර්ධන වැඩපිළිවෙළක් සකස් කෙරේ. සමුපකාර සමාගම විසින් ආයෝජනය, ණය පහසුකම්, රක්ෂණ, අවශ්‍ය උපකරණ සහ තාක්ෂණ උපදෙස් සේවාවන් සිය සාමාජිකයන් වෙත සපයනු ලැබේ. නිෂ්පාදන අලෙවි කිරීමට ද මේ සමාගම යොදා ගත හැක. සාමාජිකයන් ආයෝජනය කරන මූලධනයට අමතරව අතිරේක මූල්‍ය සම්පත් ආණ්ඩුව විසින් සපයනු ඇත.
- අස්වැන්න වැඩි කිරීම සඳහා කෘෂිකාර්මික ඵලදායිතාවය ඉහළ නැංවීම සහ තාක්ෂණික වර්ධනයන් සිදු කෙරේ.
- වී සඳහා නියම කරන ලද මිල ගොවියාට සෘජුව ලැබෙන නව මිලදී ගැනීමේ ක්‍රමයක් සැකසිය යුතු ය. බැංකු මගින් ගෙවීම් ලැබීම සහතික වීමේ ක්‍රමයක් ද ඊට ඇතුළත් කෙරේ.
- දැනට පවත්නා සහතික මිලක් යටතේ වී මිළ දී ගැනීමේ වැඩපිළිවෙළට සමාන්තරව මෙම ක්‍රියාවලිය ක්‍රියාත්මක කෙරේ.

- කුඩා ගොවිපොළවල විප්ලවය යටතේ පොහොර සහනාධාරය ලබා දෙනු ඇත. එය තේ, පොල්, රබර් හා අනෙකුත් නම් කළ බෝග සඳහාත් විහිදවනු ඇත.
- තේ, රබර්, පොල් හා සුළු අපනයන භෝග ක්ෂේත්‍ර රටට වැඩියෙන් ම අපනයන ආදායම් ලබාදෙන ක්ෂේත්‍රයන් ය. මේ නිෂ්පාදකයන් රජයට විශාල වශයෙන් බදු ගෙවනු ලැබුව ද පෙරළා ඔවුනට රජයෙන් කිසිදු සහනාධාරයක් නො ලැබේ. මේ නිසා අප මෙම භෝගයන් ලෝක වෙළෙඳපොළේ තරගකාරී මට්ටමකට ගෙන ඒමට වෙන වෙන ම වැඩසටහන් සකසා වගාවන් හා කර්මාන්තශාලාවලට ආධාර ලබාදීම කළ යුතුව තිබේ. එසේ ම වතුකරයේ සිටින සේවක පිරිසට ද හොඳ ආදායම් මාර්ග ලැබෙන පරිදි නව වැඩසටහන් සැකසීම ද මීට ඇතුළත් කළ යුතුව ඇත.
- අංග සම්පූර්ණ දිස්ත්‍රික් වෙළෙඳපොළවල් සඳහා ගබඩා සහ ශීතාගාර පහසුකම් ඇතුළු යටිතල පහසුකම් සැපයිය යුතු අතර ආහාර බෙදාහැරීමට ප්‍රාදේශීය මධ්‍යස්ථාන ජාලයක් ගොඩනැංවිය යුතු ය.

## ධීවර කර්මාන්තය

ගොවීන්ට මෙන්ම ධීවරයන්ට ව්‍යාපාරික සමුපකාර සමාගම් පිහිටුවීම සඳහා දිරිගැන්වීම් කළ යුතු ය. එවිට ධීවරයන්ට බෝට්ටු හා ආම්පන්න සපයා ධීවර කර්මාන්තය නවීකරණය සඳහා ද පියවර ගත හැකිය. ඒ යටතේ,

- ඉල්ලුමට සරිලන ලෙස ලබාදීම සඳහා මාළු අස්වැන්න අඩු නොවී පවත්වාගෙන යාමේ ක්‍රියාමාර්ගයක් අරඹා මත්ස්‍යයන්ගේ සෞඛ්‍යාරක්ෂිත බව ඉහළ නංවන ක්‍රමයක් ඇති කිරීමට කටයුතු කිරීම.
- මත්ස්‍ය වගා ක්‍රම ආරම්භ කිරීම.
- රට වටා පිහිටි ධීවර වරායන් සහ තොටුපොළ දියුණු කිරීම.
- මාළු ඇල්ලීමේ සිට අලෙවිය දක්වා තත්ත්වය පරීක්ෂා කිරීම. ඉහළ ප්‍රමිතියකින් පවත්වා ගෙන යාම.
- අපනයන වෙළෙඳපොළ දියුණු කිරීම සඳහා නව යාන්ත්‍රණයක් හා වැඩපිළිවෙලක් සැකසීම.
- රාජ්‍ය මැදිහත්වීමක් හරහා ධීවරයන්ට කෙටිකාලීනව සහන ලබාදීම.

සිදු කළ යුතුය.

## ග්‍රාමීය ආර්ථිකය පණගැන්වීම

ග්‍රාමීය ආර්ථිකයේ සංවර්ධනයට තවත් වැදගත් පියවරයන් දෙකක් ගත යුතුව තිබේ.

1. ග්‍රාමීය ආර්ථිකයට වුවමනා අවම යටිතල පහසුකම් හඳුනාගෙන ප්‍රාදේශීය මට්ටමින් ඒවා ලබා දීම.
2. මූල ධනය නොමැතිව ග්‍රාමීය ආර්ථිකයකට නාගරික ආර්ථිකය සමග තරඟ කිරීමේ හැකියාව නොමැත. ඒ නිසා ග්‍රාමීය ආර්ථික ක්‍රියාවලියෙහි යෙදී සිටින ජන කොටස්වලට උවමනා මූල ධනය විශාල ලෙස සැපයීමටත් පියවර ගත යුතු ය. නාගරික ආර්ථිකයට විදේශීය මූල ධනය ලැබීමේ අවකාශයන් ඇත ද, ගමේ තත්ත්වය එසේ නො වේ.

දුප්පත්කම වැඩියෙන් ම පවතින්නේ ග්‍රාමීය ප්‍රදේශවල ය. එම නිසා සමෘද්ධි සහ දුප්පත්කම තුරන් කිරීමේ වැඩසටහන් දැනට වඩා ශක්තිමත් කිරීමට ප්‍රමුඛත්වය දිය යුතු ය. අවම ආහාර සැපයීමේ

ක්‍රමය යටතේ ජනතාවට වසර දෙකකට දැරිය හැකි මිලක් යටතේ ආහාර ලබා දීම අතිශය වැදගත් ය.

## ඩිජිටල් විප්ලවයෙන් රැකියා

රැකියා බිහිකිරීම සඳහා අප ඩිජිටල් අංශයෙන් උපරිම ප්‍රයෝජනය ගත යුතුව තිබේ. 1991 වසරේ පැවැති පුවත් සාකච්ඡාවක දී දුරකථනයන් කඩ පොළක දී මිල දී ගත හැකි බව ද, ජංගම දුරකථන භාවිතය ආරම්භ වන බව ද මා කර්මාන්ත, විද්‍යා හා තාක්‍ෂණ අමාත්‍යවරයා ලෙස ප්‍රකාශ කළ විට සමහරු උපහාසාත්මකව සිනාසුන අයුරු මට මතකය. අද බහුතර ජනතාවක් ජංගම දුරකථන භාවිතා කරති. ස්ථාවර දුරකථනයන් ලබා ගැනිම සඳහා පෝලිම් ලැයිස්තුවේ රස්තියාදු විය යුතු නොවේ. කඩ පිලට ගිය සැණින් දුරකථන මිල දී ගත හැකි ය. අධ්‍යාපන අමාත්‍යවරයා ලෙස පරිගණක සහ රූපවාහිනිය පාසල් සඳහා හඳුන්වා දීමට මම කටයුතු කළෙමි. එසේ ම 1993 දී අග්‍රාමාත්‍යවරයා ලෙස අමෙරිකාවේ උප ජනාධිපති අල්ගෝර් මහතා සමඟ ගිවිසුමක් අත්සන් කරමින් ශ්‍රී ලංකාව ද අන්තර්ජාල තාක්‍ෂණයට ඇතුළත් කළෙමි. එදා මෙ ගිවිසුම විවේචනය කළ සියල්ලෝ අද අන්තර්ජාල පහසුව භුක්ති විඳිති.

බංගලාදේශය සිය ආර්ථික වර්ධනය 2% කින් ඉහළ නංවා ගත්තේ සන්නිවේදන තාක්ෂණය ඉහළ නංවා ගැනිම මගිනි. ඩිජිටල් ක්ෂේත්‍රයේ එක් එක් අංශවලට අදාළ තාක්‍ෂණය, එනම් පරිගණක, ගුවන් විදුලි, රූපවාහිනී, අන්තර්ජාලය, ජංගම දුරකථන අතර ඇති වෙනස අවම වී ඒ සියල්ල මේ වනවිට එක සමාන මට්ටමකට පැමිණ ඇත. ඒවා සියල්ල එකට ඒකාබද්ධ වී ඇත. එම නිසා සමස්ත කර්මාන්තය ම එක ම වෙළෙඳපොළක්, එක ම ක්ෂේත්‍රයක් බවට පත්ව ඇත. මේ ශීඝ්‍ර දියුණුව නිසා ව්‍යාපාර කටයුතුවලටත්, පොදු සේවා සැපයීමටත් අවශ්‍ය සහ තොරතුරු ශීඝ්‍රයෙන් සැකසිය හැක. ව්‍යාපාර පිරිසැකසුම් මෙහෙයුම් ආයතන බිහිවන්නේ මෙ සඳහාය. මෙ හරහා නව රැකියා බිහි කිරීමට අපට පුලුවන. මෙම ව්‍යාපාර මගින් විදේශ විනිමය පමණක් නොව සේවකයන්ට මාසිකව රුපියල් 50,000 ක පමණ වැටුපක් ද උපයා ගත හැක.

නවීකරණය හරහා වේගවත් සංවර්ධනයක් ලබා වසර 25 ක් යද්දී ස්වශක්තියෙන් නැගී සිටිය හැකි ආර්ථිකයක් ගොඩනගාගැනිමත්, අලුතින් ප්‍රාග්ධනය උපයා ගැනිමත් මේ සැලැසුමෙහි මූලික ඉලක්කයන් විය යුතු ය.

## දැනුම

*"විද්‍යුනැණයෙන් අහිසෙස් ලබමින්නේ*
*සඳ මතුපිට පියවර එසැවෙන්නේ*
*අප පමණද එක තැන කැරකෙන්නේ*
*අප තනි කර ලෝකය දිවයන්නේ"*

බණ්ඩාර ඇහැළියගොඩ ලියූ මේ ගීතය මට අසන්නට ලැබුණේ මා අධ්‍යාපන හා යෞවන කටයුතු ඇමැති වශයෙන් ලලිත් ඇතුළත්මුදලි මහතා සමග මහපොළ ව්‍යාපාරයට සම්බන්ධ වී වැඩ කරන අවදියේ ය.

ඒ අදහස එදාටත් වඩා අදට ගැලපෙන බව මට සිතේ. අද අප එක තැන කැරකෙන්නේත්, ලෝකය අප පසුකරගෙන ගොස් සිටින්නේත් ලෝකය ගමන් කරන වේගය හා ගමන් කිරීමට තරම අප දැනුමින් සන්නද්ධ නො වුණු නිසා ය. ජපානය, දකුණු කොරියාව, චීනය, මැලේසියාව, ඉන්දියාව, සිංගප්පූරුව වැනි රටවල් අප පසුකොට ඉදිරියට ම ගියේ නිෂ්පාදනය හා ඉදිකිරීම කටයුතු සඳහා නවීන තාක්ෂණය යොදාගෙන සංවර්ධනයට අත්‍යවශ්‍ය වූ තොරතුරු තාක්ෂණය දියුණු කර ගත් හෙයිනි. අපට ද එතැනට ගමන් කිරීමට නම් යහපත් අධ්‍යාපන ක්‍රමයක් වුවමනා ය.

1948 වනවිට ආසියාවේ හොඳ ම අධ්‍යාපන ක්‍රමය පැවතියේ ජපානයේ සහ ලංකාවේ ය. හොඳ ම පාසැල්, හොඳ ම විශ්ව විද්‍යාල අප සතුව පැවතිණි. නමුත් පසුව මේ තත්ත්වය අපෙන් ගිලිහී ගියේ ය. 1980 වසරේ මා අධ්‍යාපන ඇමැති ධූරයට පත්වූ විට, අපේ අධ්‍යාපන ක්‍රමය නැවත කීර්තිමත් තත්ත්වයට ගෙන ඒමට පියවර ගතිමි. ඒ සඳහා පළමුවෙන් ම කළේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඔඩුදුවා තිබූ දේශපාලනය අතුගා දැමීමට කටයුතු කිරීම ය. අධ්‍යාපන සේවය සඳහා ගුරුවරු බඳවාගෙන තිබුණේ මන්ත්‍රීවරයාගේ ලියුම කැබැල්ලට ය. මම එය වෙනස් කළෙමි. විභාගයක් පවත්වා සුදුසුකම් අනුව ගුරුවරු බඳවා ගැනීමේ ක්‍රමයක් සකස් කළෙමි. මෙහිදී අපේ පාර්ලිමේන්තු කණ්ඩායම පවා මට එරෙහි විය. දේශපාලනයෙන් තොරව සුදුසුකම් හා දක්ෂතාවය පදනම් කරගෙන ගුරුවර ගුරුවරියන් බඳවා ගැනීමට මා ගත් තීරණය නිසා ලංකා ඉතිහාසයේ ප්‍රථම වරට ඇතැම් මන්ත්‍රීවරු තමන්ගේම ආණ්ඩුවේ අධ්‍යාපන ඇමැතිවරයා වූ මට එරෙහිව විශ්වාසභංග යෝජනාවක් ගෙන ඒමට පවා කටයුතු කළහ. විභාග පැවැත්වීමෙන් තම ආධාරකරුවන්ට රැකියා ලබා දිය නො හැකි බවට ඔවුහු චෝදනා කළහ. එහෙත් අධ්‍යාපනය දේශපාලනයෙන් මුදවා ගැනීමට ගත් තීරණය මම වෙනස් නො කළෙමි.

අධ්‍යාපන පරිපාලන සේවය, පාසැල් කළමනාකරණය සඳහා විදුහල්පතිවරු පුහුණු කිරීම, ගුරුවරු පුහුණු කිරීමට අධ්‍යාපන විද්‍යා පීඨ ඇති කිරීම, ජාතික අධ්‍යාපන ආයතනයක් සකස් කිරීම ආදිය අධ්‍යාපන ක්‍රමය විධිමත් කිරීමට මා එදා ගත් පියවරයන් ය. ඉංග්‍රීසි ගුරුවරු පුහුණු කිරීමට දිස්ත්‍රික්ක මට්ටමින් ඉංග්‍රීසි භාෂාව වැඩි දියුණු කිරීමේ මධ්‍යස්ථාන ඇති කිරීම, පාසැල හැර යන අයට වෘත්තිය පුහුණුව ලබා දීම සඳහා ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය වැඩි දියුණු කිරීම, ජාතික තරුණ සේවා සභාව ඇති කිරීම වැනි පියවර ගණනාවක් ඔස්සේ අධ්‍යාපන ක්ෂේත්‍රය ශක්තිමත් කිරීමට මට හැකි විය.

## අද තත්ත්වය

අද අධ්‍යාපන ක්‍රමය මොන තරම් කඩා වැටීමකට ලක්ව ඇති ද යන්න කිවහොත් ළමයා පාසැලට ඇතුළත් කිරීමේ ආරම්භක ක්‍රියාපටිපාටියේ සිට සමස්ත අධ්‍යාපනය ම දැවැන්ත අර්බුදයකට ලක්ව ඇත. එම අර්බුදය අධිකරණය දක්වා ම ගියේය. පසුගිය කාලයේ ප්‍රශ්න පත්‍ර සම්බන්ධයෙන් මතුවූ ආරවුල් හේතුකොටගෙන විභාග පැවැත්වීම ද විශාල අවුලක් විය. කොටින් ම කිවහොත් අද රජයට පාසැලක වාර විභාගයක් හෝ නිසි ලෙස පවත්වා ගැනීමට නො හැකි වී ඇත. ගම්බද පාසැල් වලට ගුරුවරු නැතැයි නිතර ම අඳෝනා නැගෙයි. සුදුසුකම් නැති විදුහල්පතිවරුන් පත් කිරීම හේතුවෙන් ගම්බද පාසැල් විනාශයට යමින් තිබේ. අධ්‍යාපන අමාත්‍යාංශය සහ ගුරු සේවය අතර නිරන්තර ගැටුම් පවතී. උසස් අධ්‍යාපන පාඨමාලාවන් සහ ශ්‍රම වෙළෙඳපොළ අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවයක් නොමැති නිසා පාඨමාලා සහතික ලබා ගත් පසු එම සහතිකයට ඔබින රැකියාවක්, රැකියා වෙළෙඳපොළ තුළ නොමැත. වත්මන් තරුණ පරම්පරාවට පරිගණක දැනුම ලබා ගත හැකි ක්‍රමවේදයක් සකස් වී නො තිබීම ද බරපතළ අඩුවකි.

පාසැල්වලට ශිෂ්‍යයන් ඇතුළත් කිරීමේ දී සෘජුව හෝ වක්‍රව විවිධ ගෙවීම් කිරීමට සිදුව තිබේ. මෙය දෙමව්පියන්ට මහත් හිසරදයකි. අල්ලස හා දූෂණය පාසල් පද්ධතිය තුළට ද කාන්දු වී හමාර ය. ශිෂ්‍යයෙකුගේ අධ්‍යාපනය ආරම්භ වන්නේ අල්ලස මගිනි. මෙම දූෂිත ක්‍රමය තුරන් කිරීමට ඇති එක ම ක්‍රමය වන්නේ විදුහල්පතිවරයාට හෝ පාසල් සංවර්ධන අරමුදල වෙත ගෙවීම් කිරීම තහනම් කිරීම ය. එහිදී පාසැලට ආදායම් ලබාගැනීම සඳහා විකල්ප ක්‍රමවේදයන් නීතියෙන් ම සකස් කළ යුතු ය. පාසල් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය අද වන විට විකෘති වී ඇති අතර ජාතික පාසල් අතරත්, ජාතික හා ජාතික නොවන පාසල් අතරත් විශාල පරතරයක් මතුව තිබේ.

නිසි අධ්‍යාපනයක් ලබන්නට නම් පාසැල් යන ශිෂ්‍යයාගේ සෞඛ්‍යය ද අතිශයින් ම වැදගත් ය. එහෙත් අද පාසැල් යන ශිෂ්‍යයා උදෑසන ආහාර වේල නො ගනී. දිවා අහාරයත් ඉතා සුළු

මට්ටමකින් ගන්නා ශිෂ්‍යයා රාත්‍රියට පමණක් සාමාන්‍ය ආහාර වේලක් ගනී. එය ඉතාමත් නු සුදුසු තත්ත්වයකි. එය ශිෂ්‍යයාගේ සෞඛ්‍යයට ඉතා අහිතකර ලෙස බලපායි. මේ තත්ත්වය වෙනස් කළ යුතු වෙමු.

අප අවධානයට ලක් කළ යුතු අනෙක් කරුණ නම් පශ්චාත් පාසැල් අධ්‍යාපනයට තේරී පත්වන පිරිස ය. ඊට සුදුසුකම් ලබන්නේ ඉතාමත් සුළු පිරිසකි. සුදුසුකම් නො ලබන්නවුන්ට දැනුම ලබා ගැනීම සඳහා විශ්ව විද්‍යාල වැනි උසස් අධ්‍යාපන ආයතන නොමැත. ඒ නිසා බොහෝ දෙනෙකුට සිදුවන්නේ බාහිර උපාධි පාඨමාලා හැදෑරීමට යොමු වීමට ය. මෙහි ප්‍රතිඵලය රැකියා ප්‍රශ්නය තවත් උග්‍රවීම පමණි. ඊට හේතුව රැකියා වෙළෙඳපොළ තුළ අදාළ පාඨමාලාවන්ට ගැලපෙන රැකියා නොමැති වීම ය.

වයස අවුරුදු 5 දී සියලු ම ශිෂ්‍යයන් පාසැල් අධ්‍යාපනයට පිවිසිය ද 11 වසර වන විට වැඩිදුර අධ්‍යාපනය ලබන්නේ ඉන් 40% ක් පමණි. එයිනුත් උසස් අධ්‍යාපනය ලබන්නේ ඉතා සීමිත පිරිසකි. දියුණු රටවල මෙම තත්ත්වය දක්නට නො ලැබේ. දියුණු රටවල පාසැල් අධ්‍යාපනයට පිවිසෙන ප්‍රමාණයෙන් 75% ක පමණ කොටසක් පශ්චාත් පාසැල් අධ්‍යාපනයට පිවිසෙති.



**උසස් පෙළ කතාව**

*ශ්‍රී ලංකාවේ උසස් පෙළ සමත් වන සිසුන්ගෙන් සියයට 75% කට ම විශ්ව විද්‍යාල අධ්‍යාපනය සඳහා අවස්ථා හිමි නොවේ. නමුත් නිදහස් අධ්‍යාපන ක්‍රමය ක්‍රියාත්මක නො වන ඉන්දියාවේ උසස් පෙළ සමත් වන සියල්ලන්ටම විශ්ව විද්‍යාල අධ්‍යාපනය ලැබීමේ අවස්ථාව හිමිකර දී තිබේ.*

දියුණු රටවල මිනිස් සම්පත අපතේ යාමක් නැත. පශ්චාත් පාසැල් අධ්‍යාපනයේ පාඨමාලා සකස් කොට ඇත්තේ රැකියා වෙළෙඳපොළ ඉලක්ක කොටගෙන ය. එම නිසා අප ද අධ්‍යාපනයේ ව්‍යුහාත්මක සහ ගුණාත්මක බව ඉහළ නංවන ක්‍රමයක් සකස් කළ යුතු ය.

## දශක අධ්‍යාපන සැලැස්ම

වසර 10 ක් තුළ අපේ පාසැල් අධ්‍යාපනය පූර්ණ වෙනසකට ලක් කරන වැඩපිළිවෙළකට අප වහා අවතීර්ණ විය යුතු ය. එම වැඩපිළිවෙළට මුල පිරිය යුත්තේ පාසැල් ක්‍රමය තුළ ඇති කරන විප්ලවීය වෙනසකිනි. දකුණු ආසියාවේ පමණක් නොව සමස්ත ආසියාවේ ම හොඳ ම පාසැල් ක්‍රමය ශ්‍රී ලංකාවේ ඇති කිරීම අපේ ඉලක්කය විය යුතුව තිබේ.

අද ජාතික පාසැල් සහ ජාතික නො වන පාසැල් අතර විශාල පරතරයක් ඇත. මෙම පරතරය අවම කොට සියලු පාසැල් ජාතික මට්ටමකට රැගෙන ආ යුතු ය. එම ජාතික මට්ටම අභිබවා යන පාසැල්වලට විශේෂ අවස්ථා සැලසීම මගින් තරගකාරිත්වය ඉහළ නැංවිය යුතු ය.

හැම පාසැලකට ම අවුරුදු 3ක් තුළ සපුරාලීමට ඉලක්කගත වැඩපිළිවෙළක් ලබා දිය යුතු ය. අවුරුදු 3ක් තුළ එම ඉලක්කයන් සපුරන පාසැල් පෙරට ගෙන අනෙක් පාසැල්වල අඩුපාඩු හඳුනාගෙන ඒවා දියුණු කිරීමට විශේෂ සැලසුම් ක්‍රියාත්මක කළ යුතු ය.

01. හොඳ පාසැල් ක්‍රමයක් සඳහා හොඳ ගුරුවරු අත්‍යවශ්‍ය ය. ඒ සඳහා ගුරුවරු පුහුණු කළ යුතු ය. එලෙස පුහුණු කළ ගුරුවරු පාසැල්වල අවශ්‍යතාව අනුව අනුයුක්ත කරන

යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කළ යුතු ය. සෑම පාසැලකට ම අවශ්‍ය ගුරුවරු ප්‍රමාණය ලබා දීම රජයේ වගකීමකි. මා අධ්‍යාපන ඇමැතිවරයා ලෙස කටයුතු කරද්දී පාසැල් මණ්ඩලවලට ගුරුවරු ලබා දීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කළෙමි. එය වර්තමාන තත්ත්වයට ගැලපෙන ලෙස සංශෝධනය කළ යුතු ය.

02. සුදුසුකම් නොමැති කිසිදු ගුරුවරයෙක්, විදුහල්පතිවරයෙක් හෝ අධ්‍යාපන නිලධාරියෙක් පරිපාලන ක්ෂේත්‍රයේ තනතුරුවලට අනුයුක්ත කිරීම තහනම් කළ යුතු ය.

03. නු පුහුණු පුද්ගලයන් පුහුණු කිරීමට කටයුතු කළ යුතු ය. ගුරු සංවර්ධන ක්‍රමයක් සකස් කෙරුණු ඇත. විටින් විට අධ්‍යාපන ක්ෂේත්‍රයේ වැටුප් හා දීමනා සංශෝධනය කෙරෙන ක්‍රමයක් සකස් කළ යුතු ය.

04. පසුගාමී සිසුන් පෙරට ගැනීමට මූලික අවධානය යොමුකොට කටයුතු කළ යුතු අතර අවශ්‍ය නම් ප්‍රාථමික අංශය තුළ එම ශිෂ්‍යයන්ට තවත් වසරක් ගත කිරීමට අවස්ථාව සලසා දිය යුතු ය.

05. මුල් වසරේ සිට පුරා වසර 11 ක් පාසල් අධ්‍යාපනය ලබාදීම අනිවාර්ය කළ යුතු ය.

06. පාසල් විභාග පාලනය කිරීමට නීතියකුත්, විභාග දෙපාර්තමේන්තුව අධීක්ෂණය කිරීමට විභාග අධිකාරියකුත් ඇති කිරීම අද ඇති විභාග අවුලට විසඳුමකි. ඒ අධිකාරියේ සාමාජිකයන් පත් කළ යුත්තේ ව්‍යවස්ථාදායක සභාව විසිනි.

මේ මගින් වසර 10ක් ඇතුළත අපේ පාසැල් අධ්‍යාපන ක්‍රමය දැවැන්ත ධනාත්මක වෙනසකට බඳුන් කිරීමට අපට හැකියාව ලැබෙනු ඇත.

## පාසැල

ලංකාවේ පාසැල යන සංකල්පය සකස් වී ඇත්තේ වාර අවසානයේ දී පවත්වනු ලබන විභාගයන් සඳහා ශිෂ්‍ය මනස ඉලක්ක කරගත් ආයතන පද්ධතියක් ලෙස ය. පාසැලකින් සිදුවිය යුත්තේ විභාග සමත් කිරීම පමණක් නො වේ. ශිෂ්‍යයාට දැනුම හා පෝෂණය ලබා දෙන, සෞඛ්‍ය සම්පන්න බව ආරක්ෂා කරන, ක්‍රීඩා කලා ඇතුලු තරුණ ක්‍රියාකාරකම් වර්ධනය කරන, විනය ගරුක බව ඇති කරන, රටේ තිරසාර සංවර්ධනයට, ග්‍රාමීය සංවර්ධනය දිරි ගන්වන බහුකාර්ය කේන්ද්‍රයක් බවට පාසැල පරිවර්තනය කරන අලුත් සංකල්පයක් තුළ පාසැල් ආයතන පද්ධතිය ගොඩනැගිය යුතු ය.

ජාතික ප්‍රතිපත්තියක් ලෙස පාසල් ළමුන්ට පෝෂ්‍යදායී සහ සෞඛ්‍යාරක්ෂිත දිවා ආහාර වේලක් ලබාදිය යුතු ය. මුල් අදියරයේ දී එය අධික වියදම් සහගත කටයුත්තක් විය හැක. නමුත් අනාගතයේ දී සෞඛ්‍යය සම්පන්න ජාතියක් ඒ හරහා බිහි වන බැවින් සෞඛ්‍ය සඳහා වැය කළ යුතු මුදල අපට අඩු කර ගැනීමට හැකි වීමෙන් එහි වාසිය ලබාගත හැක. මෙම දිවා ආහාර වේල ලබාදීමට අප පාසල තුළ ම 'පාසල් මුළුතැන්ගෙයක්' ඇති කරලීමට කටයුතු කළ යුතු ය. එමගින් අවුරුදු පහ දක්වා වූ ශිෂ්‍යයන්ට කිරි වීදුරුවක් ලබාදීම ද ආරම්භ කළ යුතු ය.

මෙම 'පාසල් මුළුතැන්ගෙය' සංකල්පය ක්‍රියාත්මක කිරීමට නම් පාසල් සඳහා විදුලි බලය ලබාදිය යුතු ය. තෙකලා විදුලි බලය ලබාදීම තුළින් පාසල ගමේ ප්‍රධාන පරිගණක මධ්‍යස්ථානය බවට ද පත් කිරීමට පුළුවන. අද ගම්මානයන්හි පරිගණක භාවිතය ඉතා අවම ය. පරිගණක සාක්ෂරතාවය පවතින්නේ ඉතාමත්ම අඩු මට්ටමක ය. පාසල් හරහා ගමට පරිගණක තාක්‍ෂණය ලබා දීම තුළින් ශිෂ්‍යයන්ට ද, ගුරුවරුන්ට ද, ආදි ශිෂ්‍යයන්ට ද පරිගණක දැනුම ලබාගැනීමේ අවස්ථා උදාකළ හැකි ය. එමගින් පරිගණක භාවිතාව ඉහළ නඟී. ගම අන්තර්ජාලයට එක් වේ. ඒ හරහා ගම ලෝකයට

විවෘත කිරීමේ හැකියාව අපට ලැබේ. මෙම වැඩපිළිවෙළ අනුව ගමේ දැනුම් මධ්‍යස්ථානය බවට පත් වන්නේ පාසැල ය.

එපමණක් නොව ගමේ ප්‍රජා සෞඛ්‍ය වැඩසටහන් ද පාසල කේන්ද්‍ර කොට ගෙන ක්‍රියාත්මක කළ හැකි ය. ඒ හරහා පාසල් ශිෂ්‍යයන්ට මෙන් ම ගමේ ප්‍රජාවට ද සෞඛ්‍ය, පෝෂණය සහ උපදේශන සේවා ලබා දිය හැක. ළමයාගේ පළමු වෛද්‍ය වාර්තාව පාසල තුළින් ම ලබාදෙන ක්‍රමයක් සකසා එය ජීවිතය පුරාවට ම භාවිතාවට ගත හැකි ලෙස සකස් කිරීමට ද මෙමගින් පුළුවන.

මීට අමතරව තරුණ සේවා සභාව පාසැල සමග සම්බන්ධ කිරීමෙන් ක්‍රීඩා හා කලා ආදී ක්ෂේත්‍රවල සංවර්ධනය ද ලබාදීමෙන් ශිෂ්‍යයා පිරිපුන් පුද්ගලයකු බවට පත් කිරීමේ හැකියාව ලැබේ. දහම් පාසැල ද පාසැල සමග ඒකාබද්ධ කිරීමෙන් ශිෂ්‍යයාගේ ආධ්‍යාත්මික ගුණ වගාව ද පාසැල තුළින් ම ලබාදීමට හැකි වේ. ප්‍රජා පොලිස් ක්‍රමයක් පාසැලට එකතු කොට විනය ගරුක බව ඇති කිරීමට ද කටයුතු සැකසේ. මේ නිසා අවසානයේ දී විභාග සඳහා පමණක් ශිෂ්‍යයන් පුහුණු කිරීමේ සංකල්පයෙන් බැහැරව අධ්‍යාපනයි, ආහාර, සෞඛ්‍ය, ක්‍රීඩාව, කලාව ආදී සියළු දැනුමින් ශිෂ්‍යයා සන්නද්ධ කරන කේන්ද්‍රස්ථානය බවට පාසල පත් කිරීමට අපට හැකි වෙනු ඇත.

මෙම ක්‍රමය යටතේ සෑම ශිෂ්‍යයෙකුට ම නිවස, පාසල, සමාජය සමග සම්බන්ධ වාර්තාවක් සකස් කෙරේ. උදාහරණ ලෙස ශිෂ්‍යයා පාසල් නො පැමිණියේ නම් ඒ පිළිබඳ සියලු කරුණු මේ වාර්තාවට ඇතුළත් වෙයි. ඒ ඔස්සේ ඊට හේතු හඳුනාගෙන පිළියම් යෙදිය හැකිය.

එසේම පාසල් මුළුතැන්ගෙට අවශ්‍ය ආහාර ද්‍රව්‍ය සම්පාදනයේ දී හා මිළදී ගැනීමේ දී ප්‍රදේශයේ නිෂ්පාදිත ආහාර බෝගවලට ප්‍රමුඛත්වය ලබාදේ. එමගින් ප්‍රාදේශීය වෙළෙඳපොළ ද ශක්තිමත් කිරීමට හැකියාව ලැබේ. ප්‍රදේශයේ ගොවියන්ගේ නිෂ්පාදන ලබාගැනීම හරහා ප්‍රාදේශීය ආහාර නිෂ්පාදනය ද වර්ධනය වේ. එය තිරසාර සංවර්ධනය යටතේ සිදු කරන බැවින් ගමේ කෘෂිකර්මාන්තය ඉහළ නැංවේ.

## රැකියා වෙළෙඳපොළට ගැලපෙන පශ්චාත් පාසැල් පද්ධතියක්

### සැමට දැනුම

පශ්චාත් පාසැල් අධ්‍යාපන ක්‍රමය තුළින් ඕනෑ ම පුද්ගලයෙකුට තම හැකියාව හා දක්ෂතාවය උපයෝගී කොටගෙන රැකියා ආදායම් මාර්ගයක් ලබා ගත හැකි වීමේ ක්‍රමවේදයක් අප සැකසිය යුතු ය. එසේම රැකියාවක යෙදී සිටියදී වුව දැනුම වර්ධනය කර ගැනීමේ අවස්ථා උදා කළ යුතු ය. අපේ පශ්චාත් පාසැල් ක්‍රමයේ ඉලක්ක විය යුත්තේ උසස් මට්ටමේ ශිල්ප දැනුම, නව වෘත්තීය පුහුණුව, ගැඹුරු යාන්ත්‍රික අධ්‍යාපනය ලබා දීම ය. එවිට වැඩි අගයක් සහිත භාණ්ඩ නිෂ්පාදනයටත්, වැඩි වටිනාකමක් සහිත සේවා සැපයීමටත් අවශ්‍ය ශ්‍රම හමුදාවක් බිහි කළ හැකි ය. මේ හේතුවෙන් රැකියා ආදායම් ද ඉහළ යනු ඇත.

පශ්චාත් පාසැල් අධ්‍යාපන ක්‍රමය රැකියාවන් ලබාගැනීමේ ප්‍රවිශ්ය මාර්ගයක් විය යුතු ය. අධ්‍යාපන හා රැකියා ලේකම් කාර්යාංශයක් පිහිටුවීම මගින් පශ්චාත් පාසැල් අධ්‍යාපන පාඨමාලා හා දේශීය, විදේශීය රැකියා වෙළෙඳපොළ අතර මනා ගැලපීමක් ඇති කළ හැක. රජයේ ආර්ථික සංවර්ධන අංශය, ව්‍යාපාරික ක්ෂේත්‍රය ඇතුලු ඊට අදාළ සියලු දෑ සම්බන්ධීකරණයට අවශ්‍ය බලතල එම කාර්යාංශයට ලබා දිය යුතු ය.

මෙම කාර්යාංශයේ ශාඛා රට පුරා ස්ථාපිත කරනු ලැබේ. ශාඛා කාර්යාංශ මගින් රජයේ, පුද්ගලික හා විදේශ රැකියා ඇබෑර්තු සඳහා සුදුස්සන්ට රැකියා ලබා දෙනු ඇත. ඊට අමතරව විරැකියාවෙන්

පෙළෙන තරුණ තරුණියන්ට රැකියා ලබා ගැනීමේ අවස්ථා සඳහා උපදේශන සේවාවන් ද ක්‍රියාත්මක කෙරෙනු ඇත.

මිනිස් සම්පත උපරිම ලෙස ප්‍රයෝජනයට ගැනීමට නම් පාසැල් හැර යන අයට තම තමන්ගේ දැනුම කුසලතා වර්ධනය කර ගත හැකි වන පරිදි පශ්චාත් පාසැල් පද්ධතියක් සකස් කළ යුතු ය. සියල්ලන්ට ම පශ්චාත් අධ්‍යාපන පාඨමාලා හැදෑරීමේ අවස්ථා ඇති කළ යුතු ය. පාසැල් අධ්‍යාපනයෙන් පසු තමන්ගේ කුසලතා වලට අනුව ශිල්පයක්, අධ්‍යාපන උපාධියක් ලබා ගත හැකි පශ්චාත් පාසැල් පද්ධතියක් නිර්මාණය කළ යුතු ය. ඒ සඳහා ශිල්පීය දැනුම හා කාර්මික පුහුණුව ලබා දෙන ආයතන රට පුරා බිහිකිරීම රජයේ ප්‍රධාන යුතුකම වේ. රැකියාවක යෙදෙන පුද්ගලයෙකුට රැකියාවට අදාළ උසස් අධ්‍යාපනයක් ලබා ගත හැකිවන ක්‍රමයක් සැකසිය යුතු ය.

මූල්‍ය දුෂ්කරතා නිසා පශ්චාත් පාසැල් අධ්‍යාපනය ලබා ගැනීමේ සිහිනය යථාර්ථයක් කර ගැනීමට නො හැකි වූවන්ට ජාතික ශිෂ්‍යාධාර හා ශිෂ්‍ය ණය ලබා දෙන ක්‍රමයක් සකස් කළ යුතු වේ. ඒ සඳහා මහා භාණ්ඩාගාරය, බැංකු සමග ඒකාබද්ධ වූ ආයතන ඇති කළ යුතු ය. කාර්මික හා උසස් අධ්‍යාපන ක්ෂේත්‍රවල අධ්‍යාපනය ලබන ශිෂ්‍යයන් ද එකතු කොට ඔවුන්ට ද ශිෂ්‍යාධාර ලබාදීමේ නව ක්‍රමයක් සකස් කිරීමට කටයුතු කළ යුතු ය.

විශ්ව විද්‍යාලවලට ඇතුල්වීමට සුදුසුකම් සපුරන සියල්ලන්ට ම විශ්ව විද්‍යාල ප්‍රවේශය ලබා දෙන ක්‍රමවේදයක් අවශ්‍ය ය. රැකියා වෙළෙඳපොළට ගැලපෙන පාඨමාලා විශ්ව විද්‍යාල තුළ ඇතිකොට විශ්ව විද්‍යාලත්, රැකියා වෙළෙඳපොළත් අතර මනා සම්බන්ධතාවයක් ගොඩනැංවිය යුතු ය. එයින් උපාධිධරයන්ට රැකියා නොමැත යන මැසිවිල්ලට ඉඩක් නො ලැබෙනු ඇත.

ලොව විශ්ව විද්‍යාල දියුණු වන්නේ පර්යේෂණ සහ පශ්චාත් අධ්‍යාපන කටයුතු වලිනි. අපේ විශ්ව විද්‍යාල පද්ධතිය තුළ ද කෙටි කාලයක් ඇතුළත මෙම තත්ත්වය ගොඩනැංවීමට අවශ්‍ය පසුබිම සකස් කළ යුතු ය. විශේෂ පශ්චාත් උපාධි හා පර්යේෂණ වැඩසටහන් ඇති කොට විශ්ව විද්‍යාලයන්හි තත්ත්වය ඉහළ නැංවිය යුතු ය. එමගින් අපේ විශ්වවිද්‍යාලවලට ජාත්‍යන්තර පිළිගැනීමක් ලබා ගත හැකි අතර පශ්චාත් අධ්‍යාපන පරීක්ෂණ කටයුතු මගින් රට ඉදිරියට ගෙන යාමට ද පුළුවන.

## වෙනස ඇති කරන්න පුළුවන් ඔබටයි

දකුණු අප්‍රිකාවේ ගැටුම්වලින් පසුව එරට වැටී තිබූ අගාධයෙන් ගොඩගෙන දකුණු අප්‍රිකානු ජාතිය එක්සේසත් කිරීමට එරට රජය *"සත්‍ය සොයා යන කොමිසමක්"* පත් කළේ ය. එම කොමිසම තුළින් ගැටුමට මැදි වූ සියලු පාර්ශවයන් ඒකරාශී කොට ඒ තුළින් සිදු වූ අත්වැරදීම් පිළිබඳව ස්වයං විවේචනයක් හරහා වැරදි පිළිගෙන සැවොම එක්සත් වී රට ගොඩනගන වැඩපිළිවෙළක් සකස් කෙරිණි. දකුණු අප්‍රිකාව අතීත වැරදි නිවැරදි කර ගනිමින් නව මාවතකට පිවිසුණේ ඒ අයුරිනි.


වැරදි නිවැරදි කර ගනිමින් ඉදිරියට යාමේ මාර්ගය මුලින් ම අපට කියා දුන්නේ බුදු රජාණන් වහන්සේ ය. බුද්ධ ශ්‍රාවකයෝ ද විටින් විට අවස්ථානුකූලව ධර්ම සංගායනා සහ විනය කතිකාවන් ඔස්සේ නිවැරදි වෙමින් ඉදිරියට ගියහ. කතෝලික සභාව ද ජගත් සම්මේලනයන් ඔස්සේ සිය ගමන් මග නිවැරදි කරගත් අවස්ථා ඉතිහාසයේ සඳහන්ව ඇත. ශංකරාචාර්යවරුන් හා වෙනත් ආගමික නායකයින් යටතේ හින්දු දහමෙහි යම් යම් පිළිපැදීම් ද නිවැරදි වී තිබේ. උලමාවරුන් යටතේ මුස්ලිම් දහමේ පිළිපැදීම් සඳහා අර්ථකථනයන් ලබාදුන් අවස්ථා ද තිබේ. අප ද ගමන් කළ යුත්තේ ඒ මාර්ගයේ ය.

දකුණු අප්‍රිකාව ඔවුන්ට ලැබුණු එම ඓතිහාසික අවස්ථාවෙන් ප්‍රයෝජන ගත්තේ විවිධ දේශපාලන


පක්ෂ නියෝජිතයන්, ආගමික නායකයන්, බුද්ධිමතුන්, සමාජයේ විවිධ ජන කොටස් එකට එකතු වීමෙනි.

අනාගත අභියෝග ජයගැනීමේ මේ වැඩපිළිවෙළ මා ඉදිරිපත් කළේ ද ජනතාව අතරට ගෙන ගොස් එය සංවාදයට ලක් කිරීමේ අරමුණ ඇතිව ය. එම සංවාදයට ආගමික සංවිධාන, විවිධ දේශපාලන පක්ෂ නියෝජිතයන්, බුද්ධිමතුන්, සමාජයේ විවිධ ජනකොටස් එකතු කර ගැනීමට මම බලාපොරොත්තු වෙමි. මේ වැඩ පිළිවෙල වඩාත් නිවැරදි මාර්ගයක් කරා යොමු කළ හැක්කේ ද, ඒ මග ඔස්සේ ශක්තිමත් හා තිරසාර ගමනක් යා හැක්කේ ද, අවසානයේ අනාගත අභියෝගයන් ජය ගත හැක්කේ ද ඔබ අපටම ය.

අපි මේ වැඩ පිළිවෙල සත්‍යය සොයා යන මාර්ගයක් බවට පත් කර ගනිමු. එමගින් තමන්ගේ අනාගතය ගැන තීන්දු තීරණ ගැනීමේ අවස්ථාව ඔබට ලැබෙනු ඇත. ඒ අවස්ථාව ග්‍රහණය කර ගන්නවා ද, එසේත් නැතිනම් පැහැර හරිනවා ද යන්න ඔබ අද දවසේ ගත යුතු තීරණය යි.



# 'එකම රටක් එකම මගක්'



ඔබේ අදහස් යොමු කළ යුතු ලිපිනය - 117, 5 පටුමග, කොළඹ 03.

විද්‍යුත් තැපැල - future4srilanka@gmail.com

[illegible]

# ‘එකම රටක්
එකම මගක්’




ඔබේ අදහස් යොමු කළ යුතු ලිපිනය - 117, 5 පටුමග, කොළඹ 03.

විද්‍යුත් තැපැල - future4srilanka@gmail.com


වැලිගම, මුදුහමුව, අලුත්ගෙදර පදිංචි නිහාල් අබේසේකර වන මා විසින් ආර්.එස්. ප්‍රින්ටෙක් මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.